# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,848 — 1969 අප්‍රේල් 3 වැනි බ්‍රහස්පතින්ද — 1969.4.3

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු–ඇබෑර්තු ... ... ... | 515 | කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 552 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 531 | ආණ්ඩුවේ නොවන දන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දන්වීම් ... ... ... | 532 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දන්වීම ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 550 | විවිධ දන්වීම් ... ... | — |


## තනතුරු – ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගනු ලබන දිනයට හා වේලාවට පසු මෙම මූලස්ථානයට ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ. අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

6. රාජකීය ලංකා නාවික හමුදාව හා රාජකීය ලංකා ගුවන් හමුදාව ඇතුළත්, රජයේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ ඉල්ලුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතු අතර, යම්කිසි නිලධාරියෙකු තෝරා පත් කර ගනු ලැබුව හොත්, ඔහු සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළ හොත්, රජයේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය හමුදා විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

7. පහත සඳහන් ලියකියවිලි වල පිටපත් ඉල්ලුම්පතට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) තමා ලබා ඇති අධ්‍යාපනික සහතිකය/වෘත්තීය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතික.

(ඇ) අඩු ගණනේ චරිත සහතික පත් දෙකක්, මෙම සහතික පත් ඉල්ලුම්කරු පුද්ගලිකව දන්නා, හඳුනන වගකිව යුතු පුද්ගලයන්ගෙන් මෑත දී ලබා ගත් ඒවා විය යුතුය.

8. ලැබෙන ඉල්ලුම්පත් සංඛ්‍යාව ගැන සලකා බලා, අවශ්‍ය වුව හොත් ඉහත සඳහන් සුසුදුකම් ඇති අය අතුරෙන් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරා පත් කර ගැනීම කරනු ලබන්නේ, එසේ තෝරා ගත් ඉල්ලුම්කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගන්නා ඉල්ලුම්කරුවනට, එය පවත්වන ස්ථානය, දිනය සහ වේලාවන් ලියා දන්වනු ඇත. සම්මුඛ පරීක්ෂණය කොළඹ පැවැත්වෙන අතර, ඒ සඳහා ගමන් වියදම් හෝ අනිකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු නොලබන ඉල්ලුම්කරුවන්ට ඒ බව දන්වනු ඇත.

9. තෝරා පත්කරගනු ලබන ඉල්ලුම්කරු විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම අරභයා දැනටමත් පනවා ඇති හෝ මින් පසුව පනවනු ලැබිය හැකි නීති රීතිවලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ.

10. තෝරා පත් කර ගනු ලබන අයදුම්කරු හමුද පුහුණුවක් ලබා ගැනීමට හා මොනයම් හමුදා ඒකකයක නීති සම්බන්ධ කටයුතු කිරීමට බැඳී සිටිය යුතු අතර දිවයිනේ මොනයම් පළාතක වුවත් සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය.

11. සන්නද්ධ සේවා වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දායක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4ක මුදලක් අඩුකර ගැනීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් තෝරා ගනු ලබන අපේක්ෂකයා විසින් දිය යුත්තේ ය.

එම්. එල්. ඞී. ඒ. පෙරේරා,
කර්නල්,
යුද හමුදා ආඥපති වෙනුවට.

1969 මාර්තු 23 දින.

**ලංකා යුද්ධ හමුදාවේ නීති නිලධාරි තනතුර සඳහා ඉල්ලුම්පත**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ජාතිය (ලාංකිකයෙකු වූයේ පළපතින්ද? නැතහොත් ලියාපදිංචි කිරීමෙන්ද ලියා පදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න.) :————.

3. ලිපිනය :—
කාර්යාලයේ :————.
වාසස්ථානයේ :————.

4. උපන් දිනය :—
1969 අප්‍රේල් 25 වැනි දිනට වයස :————.
අවුරුදු :——, මාස :——; දින :————.

5. සම්පූර්ණ නම, උපන් ස්ථානය සහ දැන් ලිපිනය :————.
මවගේ :————.
පියාගේ :————.

6. ඔබ විවාහකද? අවිවාහකද? :————.

7. පාසැලේදී හෝ විශ්වවිද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩා ශූරත්වයන් :————.

8. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩාවන් :————.

9. සන්නද්ධ සේවයේ හෝ ස්වේඡා බල සේනාවේ හෝ ශිෂ්‍ය භට බලකායේ හෝ බාල දක්ෂ ව්‍යාපාරයන් හී හෝ ඔබ ඉහතින් කිනම් සේවයක් කර තිබේද :————.

10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද? :————.

11. මීට ඉහතින් යම්කිසි සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කෙළෙහිද? එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක්ද?
————.

12. ඔබගේ පාසැල් සමය විශ්ව විද්‍යාල සමය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න:—
පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නාමය :————.
ඇතුල් වූ දිනය :————.
අස් වූ දිනය :————.
සමර්ථ වූ ප්‍රසිද්ධ පරීක්ෂණ :————.

13. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අස් වූ දින සිට ඔබ නියුක්ත වී සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර දක්වන්න :————.
ස්වාමි පක්ෂය :————.
රැකියාවේ ස්වභාවය :————.
සේවය කළ කාලය :——, දින සිට :——, දින දක්වා.

14. ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :————.

මෙම අයදුම්පතෙහි ම විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන,

දිනය :————.

4–47—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනා ගමන මණ්ඩලයේ ඇබෑර්තුවක්

**පර්යේෂණ විනි යෝජනා හා සංවර්ධන කොට්ඨාශයේ, iii, iv හෝ v වෙනි ශ්‍රේණියේ අර්ථ ශාස්ත්‍රඥ තනතුර**

මෙම තනතුර වෙනුවෙන් අයදුම් පත් කැඳවමින්, 1969.3.14 වෙනි දින රජයේ ගැසට් පත්‍රයේ පළකල ඇතුළත් වීමේ වයස සීමාව පහත සඳහන් අයුරු වෙනස්විය යුතු බව සැළකිය යුතුයි.

**වයස.**—1969.3.1 වෙනිදාට අවුරුදු 20—45 අතර විය යුතුයි.

ඉල්ලුම් පත්‍ර 1969.4.10 වෙනි දින තෙක් භාරගනු ලැබේ.

සේවකමණ්ඩල කළමනාකාර තැන,
ලංකා ගමනා ගමන මණ්ඩලය.

200, කිරුළ පාර,
නාරාහේන්පිට, කොළඹ 5,
1969 මාර්තු මස 23 වෙනි දින.

4–145—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරු**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුරු සඳහා මෙයින් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත සඳහන් ආකාරයට පිළියෙල කරන ලද ඉල්ලුම්පත්‍ර 1969 අප්‍රේල් මස 19 වැනි දිනට හෝ ඊට මත්තෙන් මා වෙත ලැබිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ මුදුනේ වම් කෙළවරේ "යාන්ත්‍රික උපදේශක තනතුර" යන්න සඳහන් කර ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

2. වැටුප.—මෙම තනතුරට අදාල වාර්ෂික වැටුප් ක්‍රමය—රුපියල් 1,860—120—රු. 2,820 කි.

3. සේවා කොන්දේසි—

(i) මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරකි. තෝරා ගත් අයදුම්කරුවන් අවුරුදු තුනක ආධුනික කාල සීමාවකට අයත්වනු ඇත.

(ii) තෝරාගත් අයදුම්කරුවන් ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතුවේ.

(iii) තෝරාගත් අයදුම්කරුවන් දිවයිනේ මොනම ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී ඇත.

(iv) තෝරාගත් අයදුම්කරුවන් විසින් ස්ථිර ලේකම් විසින් අනුමත කෙරෙනු ලබන ඇප මුදලක් තැබීමට සූදානම්ව සිටිය යුතුය.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින්ම තමා—

(අ) 1969 අප්‍රේල් මස 1 වැනි දිනට වයස අවුරුදු 20 ට අඩු නොවූ හෝ අවුරුදු 40 ට වැඩි නොවූ බවටද (මෙම වයස් සීමා දැනට රජයේ තනතුරක් උසුලන නිලධාරීන් කෙරේ බලනොපානු ඇත);

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බවටද;

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් හයකින් පොදු අධ්‍යයන සහතිකපත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සාමාර්ථය ලබා තිබෙන බවද පහත සඳහන් සුදුසුකම් එකක් ලබා තිබෙන බවද;

(ඈ) ලංකා කාර්මික විද්‍යාලයේ වඩු වැඩ, ලෝහ වැඩ, මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ සහතිකය; හෝ

(ඉ) පිළිගත් කර්මාන්ත ශාලාවක හෝ ට්‍රැක්ටර් මධ්‍යස්ථානයක පුහුණු ශ්‍රේණියේ කාර්මිකයෙකුගේ තත්ත්වයට නොඅඩු තත්ත්වයක් යටතේ ට්‍රැක්ටර් සහ වෙනත් කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ හැසිරවීම, නඩත්තු කිරීම සහ අළුත් වැඩියා කිරීම පිළිබඳ අවුරුදු පහක පළපුරුද්ද තිබිය යුතුයි;

සංලක්ෂ්‍යය—පිළිගත් කර්මාන්තශාලාවක හෝ ට්‍රැක්ටර් ආයතනයක පුහුණු ශ්‍රේණියේ කාර්මිකයෙකුගේ තත්ත්වයට නොඅඩු තත්ත්වයක් සමග ට්‍රැක්ටර් සහ වෙනත් කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ හැසිරවීම, නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම පිළිබඳ අවුරුදු 10 ක පළපුරුද්ද සහිත කණිෂ්ඨ පාඨශාලා සහතිකය හෝ අටවැනි ප්‍රමාණයෙන් සාමාර්ථය ලත් දෙපාර්තමේන්තු සේවකයින් ද සුදුසු ඇත.

5. ඉල්ලුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම්පත්‍රවලට පහත සඳහන් සහතික පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බව්තීස්ම සහතිකපත්‍රය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ රෙගුලාසි සංග්‍රහයේ කටයුතු සඳහා නිකුත් කරන ලද සහතිකපත්‍රය භාරගනු නොලැබේ);

(ආ) තමා ලබාගෙන තිබෙන උසස්ම අධ්‍යාපන හෝ කාර්මික සහතික පත් ද;

(ඇ) තම සුදුසුකම්, චරිත ශුද්ධිය හා මෙම තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාවය යන මේවා සම්බන්ධයෙන් ළඟදී ලබා ගත් සහතිකපත්‍ර තුනක් ද වෙති. (රජයේ සේවයේ යෙදී සිටින ඉල්ලුම්කරුවන් විසින් මේ වගන්තිය යටතේ සඳහන් සහතිකපත්‍ර ඉදිරිපත් කර සිටීම අවශ්‍ය නොවේ.)

6. දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලැබ, නියමිත දිනට පසුව මෙම කාර්යාලය වෙත ලැබෙන ඉල්ලුම්පත්‍ර භාරගනු ලබන්නේ ඒවා ස්වකීය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත නියම දිනට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔහු විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණකි.

7. ඉල්ලුම්පත්‍රවල හෝ ඊට අදාල වෙනත් යම් යම් ලියකියවිලි හෝ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂගේ (පරිපාලන) ලිපිනය වෙත මිස, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂගේ (පරිපාලන) පෞද්ගලික නමට හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් කිසියම් නිලධාරියකුගේ නමට හෝ නොඑවිය යුතුය.

8. මේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ පළවන රාජ්‍ය සේවා තනතුරු සඳහා පත්කිරීම්වලටද අදාළ සාමාන්‍ය කොන්දේසි කෙරෙහි සැලකිල්ල යොමු කරවනු ලැබේ.

ඇල්. බී. මාරඹේ,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන).

1969 මාර්තු මස 24 වැනි දින,
පේරාදෙණියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

### ගොවිපල යාන්ත්‍රික උපදේශක තනතුර පිළිබඳ වූ ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය :————.

4. 1969.4.1 වැනි දිනට නියමිත වයස :—
   අවුරුදු :——, මාස :——, දවස් :——.

5. ඉල්ලුම්කරුගේ පියාගේ උපන් දිනය හා ස්ථානය :————.

6. ජාතිය :————.

7. (අ) ඉල්ලුම්කරුගේ උපන් ස්ථානය :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියාගේ උපන් ස්ථානය :————.
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා උපන් ස්ථානය :————.
   (ඈ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ උපන් ස්ථානය :————.

8. අධ්‍යාපනික සුදුසුකම් :————.

9. කාර්මික සුදුසුකම් :————.

10. පාසැලින් අස්වීමෙන් පසුව යෙදී සිටි රක්ෂාවල් :————.

11. දැනට උසුලන තනතුර හා ලබන වැටුප :————.

12. ට්‍රැක්ටර් හා අනෙකුත් කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ පරිහරණය කිරීම, පවත්වාගෙන යාම හා අළුත්වැඩියා කිරීම පිළිබඳ පළපුරුදුකම් පිළිබඳ විස්තර :————.

13. භාෂා පිළිබඳ දැනීම :—
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.

14. විශේෂ සුදුසුකම් තිබේ නම් ඒවා :————.

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කර තිබෙන විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කර සිටිමි. මෙහි සඳහන් කිසියම් විස්තරයක් හෝ තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට ප්‍රථම දැනගන්නට ලැබුණහොත් ඒ හේතුවෙන්ම මා මෙම තනතුරට නුසුදුස්සෙකු බවට පත් කරනු ලැබීමටත්, මා මේ තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව එම වරද අනාවරණය වුවහොත් මා රාජකාර්යයෙන් පහකර දමනු ලැබීමටත් යටත් විය යුතුව තිබෙන බව මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

4–92—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

### ප්‍රචාරක සහකාර තනතුර

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රචාරක සහකාර තනතුරක් සඳහා ලාංකිකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ෆෝර්මය අනුව පිළියෙල කරනලද අයදුම්පත් 1969.4.23 වැනි දිනට හෝ ඊට ප්‍රථම කොළඹ 1 ආදිපාද වීදියේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් පත බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ "ප්‍රචාරක සහකාර තනතුර" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

2. වැටුප් හා දීමනා.—තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේය :—වර්ෂයකට රු. 1,620—120×18—3.780 කි. වාර්ෂික වැටුප් රු. 2,820ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. ජීවන වියදම් දීමනාව, විශේෂ ජීවනාධාර දීමනාව හා ගෙවල්කුලී දීමනාව නියමිත ප්‍රමාණයන්ට අනුව ගෙවනු ලැබේ.

3. සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) 1969.4.23 දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හෝ 45ට නොවැඩි විය යුතුය. (රජයේ සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ හා ගණිතය/අංක ගණිතය ඇතුළු විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතිකය හෝ වඩා උසස් සහතිකයක් ලබා තිබෙන බව.

(ඇ) පත්‍ර කලා වැඩ පිළිබඳව අවු. 5 ට නොඅඩු පළපුරුද්දක් හෝ ප්‍රචාරක කටයුතු හා ප්‍රචාරක ලිපි සකස් කිරීම පිළිබඳ යටත් පිරිසෙයින් අවු. 5 ක පළපුරුද්දක් ලබා තිබෙන බව.

(ඈ) ප්‍රකාශන සකස් කිරීම හා මුද්‍රණ කටයුතු ගැන හොඳ දැනීමක් ලබා සිටි බව.

(ඉ) විශිෂ්ට චරිතයකින් යුක්ත බව.

(ඊ) ලංකාවේ පුරවැසියෙකු බව.

4. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි :—**

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම් ලබන්නා දැනටමත් ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතව රජයේ සේවයේ නොසිටින් නම් ඔහුගේ පත්වීම අවු. 3 ක ආධුනික කාලයකටද නොඑසේ නම් අවුරුදු 1 ක වැඩබලන කාලයකටද යටත් කරනු ලැබේ.

(iii) තෝරාගනු ලබන්නා දිවයිනේ නියම කරනු ලබන ඕනෑම ස්ථානයක සේවය කළයුතු ය.

(iv) රාජ්‍ය භාෂා පනතේ අවශ්‍යතාවයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම්—

(අ) ඔහු 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන වලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින්නාවූත් මතුවට පනවනු ලැබිය හැකි වූත් යම් නීති රීතිවලට සහ ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය පිළිගත යුතු ය.

5. පහත සඳහන් ලියවිලිවලින් කීපයක් හෝ සියල්ලම හෝ ඉල්ලා සිටි විට අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කළයුතු වේ :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි අනුව උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරනලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) ලබාගත් උසස්ම ශාස්ත්‍රීය සුදුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඇ) චරිත සහතික දෙකක් (මින් එකක් තම ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් වියයුතු ය.)

**සංලක්ෂ්‍යය :** 1. ඉල්ලා සිටි විට ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළයුතු අතර යම් හෙයකින් තෝරාගත හොත් උසුලනු ලබන තනතුරින් නිදහස් කළහැකි බව සඳහන් කළයුතු ය. එසේ නොමැති අයදුම්පත් ගැන සැලකිලිමත් නොවේ.

7. සෑම අයදුම් පත්‍රයක්ම ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම් පත තැපැල් කර දින 5ක් ඇතුළත එවැනි දැන්වීමක් නොලැබුණ හොත්, නම, ලිපිනය, තැපැල් කළ දිනය හා කාර්යාලය දන්වා එවිය යුතුය.

8. අයදුම්පත් හා ඒ පිළිබඳ වෙනත් ලිපි සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත හැර දෙපාර්තමේන්තුවේ වෙනත් කිසිම නිලධාරියෙකුගේ නමට නොඑවිය යුතු ය.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි වෙත අවධානය යොමු කරවනු ලැබේ.

10. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ. තැපැලේදී සිදුවන ප්‍රමාදයන් වෙතොත් එය මඟහැරවීම සඳහා සිය අයදුම්පත් කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට දැනුම් දෙනු ලැබේ.

වී. පතිරණ,
සමුපකාර සංවර්ධන කොමසාරිස්, හා
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**ප්‍රචාරක සහකාර තනතුර සඳහා අයදුම් පත්‍රය**

1. සම්පූර්ණ නම :————.
(පෙළපත් නාමය සමඟ පැහැදිලි අකුරින්)

2. ලිපිනය :————.

3. විවාහක අවිවාහක බව :————.

4. උපන් දිනය හා ස්ථානය :————.
**1969.4.23** දිනට වයස : අවු :—, මාස :—, දින :—.

5. අයදුම්කරු මීට පෙර රජයේ සේවයේ නියුක්තව සිටියේ නම් එම සේවය පිළිබඳ විස්තර :—
(i) දෙපාර්තමේන්තුවේ නම :————.
(ii) දැරූ තනතුර :————.
(iii) පත්වීමේ දිනය :————.
(iv) අස්වූ දිනය හා ඊට හේතු :————.

6. (අ) අයදුම්කරගේ පියාගේ සම්පූර්ණ නම :————.
(ආ) අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා උපන් ස්ථානය :————.
(ඈ) අයදුම්කරුගේ පියාගේ පියාගේත් පියා උපන් ස්ථානය : ————.

7. ලාංකිකයෙකු වූයේ ලියාපදිංචියෙන්ද පරම්පරාවෙන්ද යන වග :————.

8. දැනට රැකියාවක නියුක්ත නම් ඒ පිළිබඳ විස්තර :————.

9. ගැසට් නිවේදනයේ සඳහන් පරිදි ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් : ————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය) (මුල් පිටපත් නොවේ).

10. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ලබාඇති උපරිම සුදුසුකම් :————.

11. විශෙෂ අභිනිවාසිකම් සුදුසුකම් හෝ පලපුරුදුකම් තිබේ නම් ඒ පිළිබඳ විස්තර (සහතික පිටපත් අමුනා එවිය යුතුය) :—

12. චරිත සහතික පත් දුන් අයගේ නම් හා ලිපිනයන් :————.

මෙම අයදුම් පතෙහි මවිසින් සපයා ඇති කරුණු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට කලින් හෙලිවුවහොත් එයින්ම මා නුසුදුස්සෙකු කිරීමට හැකි බවත්, පත් කරනු ලැබුවායින් පසු සොයාගත හොත් කිසිම වන්දියක් නොගෙවා මා සේවයෙන් ඉවත් කිරීමට හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–91—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

අංකය : එස්.එච්. 264/67.

## පොලිස් දෙපාර්තමේන්තුව

**ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන් බඳවා ගැනීම**

ලංකා පොලිස් සේවයේ ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන්ගේ තනතුරු සඳහා ලාංකිකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව, කොළඹ කොටුවේ ඇවිලන් චතුරශ්‍රයේ පිහිටා ඇති පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂ වෙත ලිපිනය කර 69.6.1 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන ලෙස "ලියාපදිංචි කළ තැපැලෙන්" එවිය යුතුයි. දෙපාර්තමේන්තුව මගින් අයදුම් පත් නිකුත් නොකරන අතර, අයදුම් පත් සඳහා කරන ඉල්ලීම් ද පිළිගනු නොලැබේ. අයදුම් පත් එවන කවරයෙහි වම් කෙළවරෙහි "ආධුනික උප පොලිස් පරීක්ෂක අයදුම්පත" යන්න සඳහන් කළ යුතුයි.

3. වැටුප් ක්‍රමය.—

**උප පරීක්ෂකවරුන් :**

ප්‍රථම වර්ෂය : වර්ෂයකට රු. 1,740.

දෙවන වර්ෂය : වර්ෂයකට රු. 1,980.

ඊටපසු : වර්ෂයකට රු. 2,220—5×120—රු. 2,820.

**පරීක්ෂකවරුන් :**

III වැනි පන්තිය : වර්ෂයකට රු. 3,060—10 × 120—රු. 4,260.

II වැනි පන්තිය : වර්ෂයකට රු. 4,440—4 × 180—රු. 5,160.

I වැනි පන්තිය : වර්ෂයකට රු. 5,340—2 × 180—2 × 240—රු. 6,180.

(රු. 3,060, 4,440 සහ රු. 5,340 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්)

(බඳවා ගනු ලබන්නේ රු. 2,820 වාර්ෂික උපරිම වැටුපට එළඹ සිටින යෝග්‍ය උප පරීක්ෂකයින් උසස් කිරීමෙනි)

**ප්‍රධාන පරීක්ෂකවරුන් :**

වර්ෂයකට රු. 6,420—3 × 240—1 × 360—රු. 7,500. (බඳවා ගනු ලබන්නේ පරීක්ෂක නිලයෙන් තෝරා ගැනීමෙන් වන අතර, එය ජ්‍යෙෂ්ඨතාවය සහ කුශලතාවය මත රඳා පවතී).

4. (1) **වයස් සීමාව.**—1969.6.1 වැනි දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 19 ටත් 25 ටත් අතර විය යුතුයි. සේවා මුක්ත භටයන්ට හා ලංකාවේ එක්සත් රාජධානි කඳවුරුවල නියුක්තව සිටි සේවක යන්ට අංක 427 සහ 434 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛණයන්ගේ සඳහන් වයස පිළිබඳ අනුග්‍රහ හිමි වේ.

(ii) අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම් ඇති සෙසු සියලුම අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ පොලිස් කොස්තාපල්වරුන්ට සහ සැරයන්වරුන්ටද ඔවුන්ගේ වයස 1969.6.1 වැනි දිනට අවුරුදු 30 ට අඩු නම් මේ සඳහා ඉල්ලුම් කළ හැකිය. එවැනි අයදුම් පත් ඒ ඒ පළාත්/දිස්ත්‍රික්ක කොට්ඨාශ භාර නිලධාරීන් මගින් කොළඹ කොටුවේ ඇම්ලින් චතුරශ්‍රයේ පිහිටා ඇති පොලිස් අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

5. අධ්‍යාපනික, ශාරීරික හා වෙනත් සුදුසුකම්.—

(අ) අයදුම්කරුවන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව වාර දෙකකට නොවැඩි ගණනක දී විෂයයන් 6 කින් සාමාර්ථය ලබා සිටිය යුතුයි. ක්‍රීඩා සුදුසුකම් හිමි අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. සේවා මුක්ත භටයන් හා ලංකාවේ එක්සත් රාජධානි කඳවුරුවල නියුක්තව සිටි සේවකයින් කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සමත් වී ඇත්නම්, මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සෝ වෙති.

(ආ) උස: අඩි 5 අඟල් 6 (අඩුම), පපුව: අඟල් 34 යි (හුස්ම නාල්ලා).

ඇස් පෙනුම: පෙනීම එක් ඇසකින් 6/12 අඩු නොවිය යුතුය. එක් ඇසක පෙනුම 6/6 නම් අනෙක ඇසෙන් 6/18 පෙනුම පිළිගනු ලැබේ. වර්ණ පෙනුම සාමාන්‍ය විය යුතුයි. යම් අපේක්ෂකයකු උපැස් පාවිච්චි කරන්නේ නම් ඔහු සේවයට නුසුදුස්සෙකි.

සැලකිය යුතුයි.—දිවයිනේ හෝ විදේශයන්හි ක්‍රීඩා තරඟ ආදියට සහභාගි වී විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබා ඇති අයදුම්කරුවන්ගේ උසෙහි හෝ පපුවෙහි මිණුම්වල මඳ ඌණතාවයක් ඇති වුවත්, සෙසු අවශ්‍යතාවන්ට අනුකූල වේ නම් ඔවුන්ගේ අයදුම් පත්ද, පිළිගනු ලැබේ.

(ඇ) අයදුම්කරුවන් අවිවාහකයින් විය යුතුයි. සේවා මුක්ත භටයන් හා ලංකාවේ එක්සත් රාජධානි කඳවුරු වලින් මුදා හැරි සේවකයින්ද, පොලිස් අයදුම් කරුවන්ද, අවශ්‍යතාවයෙන් මුදනු ලැබේ.

(ඈ) තෝරාගත් අපේක්ෂකයින් පත්වීම ලැබීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි. පොලිස් සේවය සඳහා නුසුදුසු යයි තීරණය කරනු ලබන අපේක්ෂකයින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. **බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු සහ අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට සහ පොලිස් අනුග්‍රාහ වැනි වෙනත් දෙපාර්තමේන්තු අරමුදල් වලට දායක විය යුතුයි.

7. (i) පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට සීමා වේ.

(ii) තෝරා ගනු ලබන අපේක්ෂකයින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහාද විශේෂයෙන්ම 1956 අංක 33 රාජ්‍ය භාෂා පණතේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම පිණිස සම්පාදිතව පවත්නා හෝ මින් මතුව සම්පාදනය කෙරෙනා හෝ යම් ව්‍යවස්ථාවනට අනුකූල වීම අවශ්‍ය වේ.

(iii) තෝරා ගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි, කාර්‍ය සංවිධානයෙන් වන රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, පොලිස් විනය නීති සංග්‍රහය සහ පොලිස්පති වරයා විසින් හෝ රජය විසින් හෝ විටින් විට නිකුත් කරන නියෝගයන්වලට යටත් විය යුතුයි.

(iv) සෑම අපේක්ෂකයෙකුම පත්වීම ස්ථිර කිරීමට පෙර නියම කරන ලද දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත් විය යුතුයි. දෙපාර්තමේන්තු පරීක්ෂණ වලින් අසමත් වන හෝ පොලිස් රාජකාරිවලට නුසුදුසු යැයි පිළිගැනෙන අය සේවයෙන් අස් කිරීමට ඉඩ තිබේ.

(v) ඔවුන්ගේ පත්වීම ස්ථිර කරන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. මේ සඳහා අවුරුදු දෙකක සතුටුදායක සේවයක් ඇති ආධුනික උප පොලිස් පරීක්ෂක වරුන් ගෙන් ලැබෙන ඉල්ලුම්පත් සලකා බලා පොලිස්පති වරයාගේ අභිමතය පරිදි අවසර දෙනු ලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ එන රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි වලට අවධානය යොමු කළ යුතුයි.

9. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්වලට පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි :—

(i) උප්පැන්න සහතිකය.

(ii) මෑතදී ගන්නා ලද චරිත සහතික දෙකක්.

(iii) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

10. අවසාන දිනට පසුව ලැබෙන සහ මෙම ගැසට් නිවේදනයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද, ඒවාට පිළිතුරු සපයන්නේ නැත.

ඊ. එල්. අබේගුණවර්ධන,
පොලිස් පති.

1969 මාර්තු මස 25 වැනි දින,
කොළඹ 1, පොලිස් මූලස්ථානයේදී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

### ආධුනික උප පොලිස් පරීක්ෂක

1. සම්පූර්ණ නම (අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ සඳහන්ව ඇති පරිදිම විය යුතුයි) :————.

2. පියාගේ සම්පූර්ණ නම :————.

3. පියාගේ රැකියාව :————.

4. අයදුම්කරු උපන් ස්ථානය :————. පළාත :————.
උපන් ස්ථානයට කිට්ටු පොලිස් ස්ථානය :————.

5. උස :————. පපුව :————. (හුස්ම නාල්ලා)

6. 1969.6.1 දිනට වයස :————. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

7. (අ) ජාතිය :————.

(ආ) ඔබ පරම්පරාවෙන් ලාංකිකයෙකු නම් උපන් ස්ථානය :— පදිංචි වීමෙන්ද? (ලියාපදිංචි වීමෙන් නම්, එම සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.

(ඇ) ඔබ පරම්පරාවෙන් ලාංකිකයෙකු නම් උපන් ස්ථානය :— ————.

(i) අයදුම්කරුගේ :————.

(ii) ඔබේ පියාගේ :————.

(iii) පිය පක්ෂයේ මුත්තාගේ :————.

(iv) පිය පක්ෂයේ මී මුත්තාගේ :————.

8. දැනට ලිපිනය :————.

එම ලිපිනයට ඉතා කිට්ටු පොලිස් ස්ථානය :————.

9. (අ) විවාහකද ? :————.

(ආ) අනියම් බිරිඳක් සිටීද ? :————.

10. දැනට කරන රැකියාව :————.

11. යුධ හමුදාවේ සේවය කරන්නෙහිද ? නැතහොත් යුධ හමුදාවේ හෝ ලංකාවේ එක්සත් රාජධානි කඳවුරුවල සේවය කළෙහිද ? ————.
(අස්වීමේදී දෙන ලද සහතිකයේ පිටපතක් අමුණන්න).

12. අධ්‍යාපනික සුදුසුකම් :————.
(සමත් වී ඇති උසස්ම විභාගයේ සහතිකවල පිටපත් අමුණන්න).

13. විශේෂ සුදුසුකම් තිබේද ? :————.

14. අයදුම්කරු ගැන විමසීම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :————.

15. (අ) ඔබ මීට පෙර පොලිස් සේවයට බැඳීමට ඉල්ලුම් කළෙහිද ? එසේ නම් විස්තර දෙන්න :————.
(එවන ලද පිළිතුරේ පිටපතක් එවන්න)

(ආ) ඔබ මීට පෙර පොලිස් සේවයේ සිටියෙහිද ? ————.

16. ඔබ හෝ ඔබේ කිසියම් ඥාතියෙකු යම්කිසි අපරාධයක් සම්බන්ධයෙන් නඩුවකට පැටලී, උසාවියට කැඳවනු ලැබ, නඩු පවරනු ලැබ හෝ දඬුවම් ලබා හෝ ඇද්ද? එසේ නම් විස්තර සපයන්න :————.

ඉහත සඳහන් කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය ඒවා බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සැලකිය යුතුයි : අයදුම්කරුවන් විසින්ම අවශ්‍ය කරුණු පුරවා ඉල්ලා ඇති සහතික පිටපත් සමග පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි :—

පුහුණු කිරීමේ අධ්‍යක්ෂක,
පොලිස් අභ්‍යාස විද්‍යාලය,
ඇම්ලින් චතුරශ්‍රය, කොළඹ 1.

4-110—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශය—සහකාර පරීක්ෂක තනතුර

පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ සහකාර පරීක්ෂක තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් ඉල්ලුම් පත්‍ර 1969.4.20 දින හෝ ඊට පෙර මා වෙත ලැබිය යුතුය.

2. **වැටුප් හා දීමනා.**—මෙම තනතුර සඳහා නියමිත වැටුප් මෙසේ ය. රු. 1,860න් පටන් ගෙන වර්ෂයකට රු. 120 බැගින් රු. 3,780 දක්වා වැඩිවන වාර්ෂික වැටුප් ක්‍රමයකි.

3. **සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 3ක ආධුනික කාලයකට යටත්වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්—**

සෑම අයදුම්කරුවෙක්ම—

(අ) වයසින් අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30කට නොවැඩි බවත්,

(ආ) මනා චරිත ශුද්ධියකින් හා යහපත් ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත බවත්,

(ඇ) ගණිතය විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ තවත් විෂයන් හතරකින් දෙකකට නොවැඩි වාර ගණන කදී අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ගණිතය විෂයයක් වශයෙන් ඇතිව එයට සමාන හෝ උසස් විභාගයකින් සමත් වූ අයෙකු බවත්,

(ඈ) (i) කටුබැද්දේ ප්‍රායෝගික විද්‍යායතනයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨමාලාව (ඇවුරුදු දිවා පන්තිය) හෝ මහ නගර සභා ඉංජිනේරු පාඨමාලාව (තුන් අවුරුදු සවස පන්ති) සම්පූර්ණ කිරීමෙන් පසුව ඊට අමතරව අවුරුද්දක ප්‍රායෝගික අත්දැකීමක් ඇති බව හෝ,

(ii) රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක හෝ ඉදි කිරීමේ වැඩ පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 7ක පළපුරුද්දක් ඇති බව ඔප්පු කිරීමට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

**සටහන.**—තෝරා ගැනීමට පෙර ඉහත සඳහන් (ඈ) (ii) යටතේ වූ සුදුසුකම් ලබා සිටින ඉල්ලුම්කරුවන් ලංකා කාර්මික විද්‍යාලය මගින් පවත්වනු ලබන ඉහත සඳහන් (ඈ) (i) යටතේ වූ ඉල්ලුම්කරුවන්ගෙන් අපේක්ෂිත තත්වයට නොඅඩු තත්වයකින් යුත් ලිඛිත පරීක්ෂණයකින් සමත් විය යුතුය.

5. සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම තම ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම පිළිබඳ සහතික පත්‍ර හෝ ආධාර ලබන පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් වන කටයුතු සඳහා දෙනු ලබන සහතික පත්‍ර හෝ භාරගනු නොලැබේ.)

(ආ) ඉල්ලුම්කරු ලබා ඇති උසස්ම අධ්‍යාපනික හා කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඇ) මෙම තනතුරු සඳහා ඉල්ලුම්කරුගේ සුදුසුකම්, චරිත ශුද්ධිය හා යෝග්‍යතාවය පිළිබඳව මෑතදී ලබාගත් සහතික තුනක් (දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින ඉල්ලුම්කරුවන් මෙම උපඡේදය යටතේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

**සැ. යු.**—මෙම සහතික පත්‍රවල හා චරිත සහතිකවල පිටපත් ඉල්ලුම්කරුවන් වෙත ආපසු එවනු නොලැබේ.

6. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කොට නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත නියමිත දිනට කලින් ලැබී එහිදී ප්‍රමාද වී නම් ඊට හේතුව වශයෙන් පිළිගත හැකි කරුණු දක්වා එය භාර ගන්නා ලෙස එම දෙපාර්තමේන්තු ප්‍රධානියා නිර්දේශ කළහොත් මිස භාරගනු නොලැබේ.

7. මෙම තනතුරු සඳහා එවන ඉල්ලුම් පත්‍ර ද ඒ සම්බන්ධ එවන ලියුම් ආදිය ද එවිය යුත්තේ පළාත් පාලන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, (ආයතන හා ගිණුම්) වෙත මිස මේ අංශයේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ ප්‍රථම භාගයේ දෙවැනි ඡේදයේ මුලින් දැක්වෙන රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීම පිළිබඳ වූ සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

ඩබ්ලිව්. පද්මනාදන්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන හා ගිණුම්).

පළාත් පාලන අමාත්‍යාංශයේ,
නගර හා ග්‍රාම නිර්මාණ අංශය,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
1969.3.25.

### පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ සහකාර පරීක්ෂකවරයෙකුගේ තනතුර පිළිබඳ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා ස්ථානය :————.
4. ජාතිය :————.
5. දැනට රක්ෂාවක් කරයි නම් එය :————.
6. දැනට රක්ෂාවක් නොකරයි නම්, අන්තිම වරට කළ රක්ෂාව :————.
7. ලැබුණ වැටුප :————.
8. අධ්‍යාපනික සුදුසුකම් (සමර්ථ වූ විභාග සඳහන් කරන්න): ————.
9. කාර්මික සුදුසුකම් (සමර්ථ වූ විභාග සඳහන් කරන්න): ————.
10. පුහුණුවීම හා පළපුරුද්ද පිළිබඳ විස්තර, දින සහිතව: ————.
11. කලින් කරන ලද රක්ෂාවන් සහ ලබන ලද පළපුරුද්ද පිළිබඳ විස්තර, දින සහිතව :————.
12. කලින් රජයේ දෙපාර්තමේන්තුවක සේවය කළේ නම්, ඉන් අස්වීමට හේතුව :————.
13. අපරාධ නඩුවක් සම්බන්ධයෙන් උසාවියකින් දඬුවම් ලබා ඇත් නම්, වරද හා දඬුවම පිළිබඳ විස්තර :————.

————,
අත්සන.

දිනය :————.

4–165—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශය

### පරීක්ෂක තනතුර

පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ පරීක්ෂක තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරගත් ඉල්ලුම් පත්‍ර 1969. 4. 20 වෙනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබිය යුතුය.

2. **වැටුප් දීමනා හා සේවා කොන්දේසි :—**

(i) මෙම තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය මෙසේ ය :— රු. 3,900 න් පටන්ගෙන වර්ෂයකට රු. 180 බැගින් රු. 5,340 දක්වා වැඩිවන වාර්ෂික වැටුපක් මේ තනතුර සඳහා ගෙවන අතර, රු. 4,980 දී හා කාර්යක්ෂමතා කඩ ඉමක් ද වෙයි.

(ii) තෝරාගත් ඉල්ලුම්කරු කාර්යක්ෂමතා කඩඉමෙන් ඉහළට උසස් කරනු ලබන්නේ ඔහු කටුබැද්දේ ප්‍රායෝගික විද්‍යායතනයේ ගොඩනැගිලි තැනීම පිළිබඳ පාඨමාලාවේ I කොටස හා II කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කළහැකි වුවහොත් පමණි.

3. **සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත්වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම් :—**

සෑම අයදුම්කරුවෙක්ම—

(අ) වයසින් අවුරුදු 25 ට නො අඩු අවුරුදු 45 ට නොවැඩි බවත් ;

(ආ) මනා චරිත ශුද්ධියකින් හා යහපත් ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත බවත්,

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වූ අයෙක් බවත්,

(ඈ) මැනීම හා මට්ටම් කිරීම පිළිබඳ සර්වේයර් ජනරාල් ගේ බලපත්‍රය ලබා ඇති අයෙකු බවත්,

(ඉ) මැනීම පිළිබඳව හෝ, ගොඩනැගිලි නැනීම පිළිබඳව හෝ සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳව හෝ, නගර නිර්මාණය පිළිබඳව හෝ අවුරුදු 8 ක පළපුරුද්දක් ඇත්තකු බවත්, ඔප්පු කිරීමට සුදුසු සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය.

**සැ. යු.** :—ගොඩනැගිලි නැනීම පිළිබඳ දැනුමක් ඇති ඉල්ලුම් කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. සෑම ඉල්ලුම්කරුවකු විසින්ම තම ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ.) අමුණා එවිය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය (**සැ. යු.**—බවුතීස්ම පිළිබඳ සහතික පත්‍ර හෝ ආධාර ලබන පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් වන කටයුතු සඳහා දෙනු ලබන සහතික පත්‍ර හෝ භාරගනු නොලැබේ.)

(ආ) ඉල්ලුම්කරු ලබා ඇති උසස් ම අධ්‍යාපන හා කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඇ) මෙම තනතුර සඳහා ඉල්ලුම්කරුගේ සුදුසුකම්, චරිත ශුද්ධිය හා යෝග්‍යතාවය පිළිබඳව මෑතදී ලබාගත් සහතික 3 ක් (දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින ඉල්ලුම්කරුවන් මෙම උපඡේදය යටතේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

**සැ. යු.**—මෙම සහතික පත්‍රවල හා චරිත සහතික වල පිටපත් ඉල්ලුම් කරුවන් වෙත ආපසු එවනු නොලැබේ.

6. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කොට නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත නියමිත දිනයට කලින් ලැබී එහිදී ප්‍රමාද වී නම් ඊට හේතුව වශයෙන් පිළිගත හැකි කරුණු දක්වා එය භාර ගන්නා ලෙස එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිර්දේශ කළොත් මිස, භාරගනු නොලැබේ.

7. මෙම තනතුර සඳහා එවන ඉල්ලුම් පත්‍රද, ඒ සම්බන්ධව එවන ලියුම් ආදියට එවිය යුත්තේ පළාත් පාලන අමාත්‍යාංශයේ, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන හා ගිණුම්) වෙත මිස, මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ ප්‍රථම භාගයේ දෙවැනි ඡේදයේ මුලින් දක්වෙන රාජ්‍ය සේවයේ තනතුරු වලට පත් කිරීම පිළිබඳ වූ සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

ඩබ්ලිව්. පද්මනාදන්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන හා ගිණුම්),
පළාත් පාලන අමාත්‍යාංශය.

ඩී. ආර්. විජේවර්ධන මාවත,
1969. 3. 25

### පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ පරීක්ෂකවරයෙකුගේ තනතුර පිළිබඳ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා ස්ථානය :————.
4. ජාතිය :————.
5. දැනට රක්ෂාවක් කරයි නම් එය :————.
6. දැනට රක්ෂාවක් නොකරයි නම්, අන්තිම වරට කළ රක්ෂාව:
7. ලැබුන වැටුප :————.
8. අධ්‍යාපන සුදුසුකම් :————.
   (සමර්ථ වූ විභාග සඳහන් කරන්න.)
9. කාර්මික සුදුසුකම් :————.
   (සමර්ථ වූ විභාග සඳහන් කරන්න.)
10. පුහුණුවීම හා පළපුරුද්ද පිළිබඳ විස්තර, දින සහිතව :————.
11. කලින් කරන ලද රක්ෂාවන් සහ ලබන ලද පළපුරුද්ද පිළිබඳ විස්තර, දින සහිතව :————.
12. කලින් රජයේ දෙපාර්තමේන්තුවක සේවය කළේ නම්, ඉන් අස්වීම හේතුව :————.
13. අපරාධ නඩුවක් සම්බන්ධයෙන් උසාවියකින් දඬුවම් ලබා ඇත්නම්, වරද හා දඬුවම් පිළිබඳ විස්තර :————.

————.
අත්සන.

දිනය :————.

4-166—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ශාරීරික අධ්‍යාපන පරීක්ෂක තනතුරු (සිංහල)

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ශාරීරික අධ්‍යාපන පරීක්ෂක තනතුරු සඳහා මෙහි පහත දක්වා ඇති සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයින් ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. පහත සඳහන් කරනු ලබන ආකෘති පත්‍රයට අනුව එවිය යුතු ඉල්ලුම් පත්‍ර 1969.4.20 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලන ශාඛාවේ ස්ථිර ලේකම් වෙත එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය රු. 1,980න් පටන්ගෙන රු. 120 වාර්ෂික පඩි වැඩිවීම් 16කින් රු. 3,900 දක්වා නඟී රු. 2,820ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ.

3. **සේවයට බඳවා ගැනීමේ නියමයන්.**—(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මුල් අවස්ථාවේදී පත්වීම ලබා අවුරුදු තුනක් ගතවනතුරු ආධුනික තත්ත්වයේ සිටිය යුතුය.

(ii) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. කාන්තාවක් මෙම තනතුරට පත් කරනු ලැබුවහොත්, ඇය අර්ථ සාධක අරමුදල් ප්‍රතිලාභයන්ට හිමිකාරියක් වන අතර ඒ සඳහා ඇය විසින් ඇයගේ වැටුපෙන් සියයට පහක දායක මුදලක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතුය. දස වසක මුළු සේවා කාලය සම්පූර්ණ කිරීමට ප්‍රථම ඕනෑම අවස්ථාවකදී නිලධාරිනියක් විසින් තවදුරටත් අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවන්නේ ද, විශ්‍රාම වැටුප් ක්‍රමයට මාරු කළ යුතු ද යන්න ගැන සිය මනාපය දක්වා සිටිය යුතුය. පාසැල් ගුරු විශ්‍රාම වැටුප් රෙගුලාසිය යටතේ හා/හෝ රජයේ අර්ථ සාධක අරමුදලට අයත් තනතුරක දස වසක සේවාවක් සම්පූර්ණ කර තිබේ නම් තනතුරට පත්වීම මාස 6 ක් තුළ දී සිය මනාපය ප්‍රකාශ කළ යුතුය.

(iii) දැනටමත් විශ්‍රාම වැටුප් හිමි ස්ථිර තනතුරක් දරණ නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු මුල් අවස්ථාවේදී මෙම තනතුරෙහි වැඩ බැලීම සඳහා පත් කරනු ලැබේ.

4. **සේවා කොන්දේසි.**—රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා නව ප්‍රවේශකයෙකු නම් —

(i) ඔහුගේ/ඇයගේ ආධුනික/පරීක්ෂණ කාලය අවුරුදු තුනක් විය යුතුය.

(ii) ඔහු/ඈ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධිවිධාන වලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින්නා වූත් හෝ මතුවට පණවනු ලැබිය හැකි වූ හෝ යම් නීතිරීති වලට සහ ව්‍යවස්ථා වලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය පිළිගත යුතුය.

(iii) ඔහුගේ/ඇගේ ආධුනික/පරීක්ෂණ කාලය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමට සෑහෙන දැනුමක් ලබාගත යුතුය.

(iv) ආධුනික/පරීක්ෂණ කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, පත්වීමේ දිනයේ සිට පිළිවෙලින් අවුරුද්දක්, අවුරුදු දෙකක් සහ අවුරුදු 3 ක් ඇතුළත I වැනි ශ්‍රේණියේ II වැනි ශ්‍රේණියේ සහ III වැනි ශ්‍රේණියේ පරීක්ෂණයන්ගෙන් (නැතහොත් අදල වන අවස්ථාවල අවුරුද්දක් සහ අවුරුදු 2 ක් ඇතුළත I වැනි ශ්‍රේණියේ සහ II වැනි ශ්‍රේණියේ පරීක්ෂණයන්ගෙන්) සමත්වීම උඩ රඳා පවතී.

නියමිත කාලසීමාවන් තුළදී නියමිත පරීක්ෂණයන්ගෙන් සමත් නොවූවහොත් එය ඔහුගේ වැටුප් වැඩිවීම් අත්හිටුවීමට හේතුවේ. නියමිත කාලයෙන් පසු තවත් සමයක් ගතවන්නට පෙර පරීක්ෂණයෙන් සමත් නොවූවහොත්, වැටුප් වැඩිවීම්, අත්හිටුවීම, වැටුප් වැඩිවීම් නතර කිරීමකට පරිවර්තනය කර පරීක්ෂණය සමත්වන තෙක් හෝ මෙහි පහත v වන ඡේදයේ ඇති විධිවිධාන අදල වන කාලය එනතෙක් හෝ එම නතර කිරීම ක්‍රියාත්මකව තබනු ඇත.

(v) ආධුනික/පරීක්ෂණ කාලය අවසාන වන විට නියමිත සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගතහොත් අංක 120 සහ 121 යන පරිපාලන රෙගුලාසිවල විධිවිධාන අදාල වනු ඇත.

(ඉහත සඳහන් iii, iv සහ v යන කොන්දේසි සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබුවන්ට අදාල නොවේ.)

5. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකුම —

(අ) 1969.4.20 දිනට වයස අවුරුදු 23 ට වැඩි හා අවුරුදු 40 ට අඩු විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන හෝ උසස් සහතික පත්‍රයක් ලබා ඇති බවට ද,

(ඇ) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත් ශාරීරික අධ්‍යාපන විද්‍යාලයකින් ලත් සහතිකයක් දරන බවට හා එම සහතික පත්‍රය ලැබීමෙන් පසු තෙවර්ෂ කාල පරිච්ඡේදයක ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පළපුරුද්දක් ඇති බවට හෝ රජයේ හෝ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත් පාසලක හෝ ගුරු විද්‍යාලයක ශාරීරික අධ්‍යාපන උපදේශකයකු/උපදේශිකාවකු වශයෙන් පස් වසක පළපුරුද්දක් ඇති බවට හෝ සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(ඈ) සිංහල භාෂාව පිළිබඳ මනා දැනුමක් ලබා තිබිය යුතුය.

(ඉ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්තවිය යුතුය.

6. ඉල්ලුම්කරුවන් විසින් මෙහි පහත දැක්වෙන ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) ස්වකීය ඉල්ලුම් පත්‍රවලට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සංලක්ෂය.—බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද සහතික භාරගනු නො ලැබේ.)

(ආ) ශාස්ත්‍රීය සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ ලබා තිබෙන උසස්ම සහතික පත්‍ර.

(ඇ) ඉල්ලුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම් කල්ක්‍රියාව හා තනතුරට පත් කරනු ලැබීමට යෝග්‍යතාව පිළිබඳ මෑතදී ලබාගත් සහතික තුනක් (සංලක්ෂය.—දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් විසින් මේ අනුඡේදය යටතේ සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යය

7. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ පලකර තිබෙන රජයේ සේවයේ තනතුරු වලට පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසිවලට සැලකිල්ල යොමු කරනු ලැබේ.

8. මුද්‍රිත අයදුම් පත්‍ර සපයනු නො ලැබේ. ආකෘති පත්‍ර පහත පෙනෙන ආදර්ශ ආකෘති පත්‍රයෙන් පිටපත් කරගත යුතුය.

9. දැනට රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනයෙන් පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් භාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලැබී තිබුණ හොත් හා අයදුම්පත් පමාවීමට සෑහෙන හේතූන් දක්වමින් එම අයදුම්පත් භාර ගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිර්දේශ කළහොත් පමණකි.

10. සියලුම අයදුම් පත්‍ර ලැබුණ බව දන්වා එවනු ලැබේ. අයදුම් පත්‍ර භාර ගැනීම අවසන් කොට සති 3 ක් ඇතුළත එසේ දන්වා එවනු නො ලැබූ අයදුම්කරුවන් විසින් ඒ බව සාමාන්‍ය පරිපාලන ශාඛාවේ, ස්ථිර ලේකම් තැනට වහාම දන්වා එවිය යුතුය. මෙම නියමය නොපිළිපැදීම අයදුම් කරුවෙකු ගැන සලකා බැලීම සඳහා ඇති අයිතිවාසිකම් නැතිවීමට හේතු වනවා ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

සාප/22/151
1969 මාර්තු මස 27 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ ආකෘති පත්‍රය

**ශාරීරික අධ්‍යාපන පරීක්ෂක තනතුරු පිළිබඳ ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. 1969.4.20 වැනි දිනට නිවැරදි වයස :—
 අවු :————, මාස :————, දින :————.

4. ජාතිය හා එය ලද අන්දම :————.

5. උපන් ස්ථානය :—
 (අ) ඉල්ලුම්කරු :————.
 (ආ) ඔහුගේ/ඇයගේ පියා :————.
 (ඇ) පියාගේ පියා :————.
 (ඈ) පියාගේ පියාගේත් පියා :————.

6. ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන වූ හෝ උසස් පරීක්ෂණයකින් ඔබ සමත් වී සිටින්නේ ද? (එසේ නම් එය සමත් වූ මාධ්‍යයත්, සහතික පත්‍රයේ නමත් සඳහන් කරන්න. එහි පිටපතක් ඇමිණිය යුතුය) :————.

7. ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ලබා ඇති සුදුසුකම් (සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුය) :————.

8. පහත සඳහන් භාෂාව පිළිබඳ දැනුම :—
 (අ) සිංහල :————.
 (ආ) දෙමළ :————.
 (ඇ) ඉංග්‍රීසි :————.

9. ඉගෙනීම ලැබූ පාසැල් හා විද්‍යාල :————.

10. දැනට යෙදී සිටින රක්ෂාව විස්තර සහිතව (ගුරුවරයෙකු නම් ලියාපදිංචි කළ අංකය, පාඨශාලාවේ නම, දැනට ලබන වාර්ෂික වැටුප, වැටුප් ක්‍රමය හා මීළඟ වැටුප් වැඩිවීමේ දිනය) :————.

11. ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ලත් ප්‍රායෝගික පළපුරුද්ද (මෙහි පහත දැක්වෙන පෝර්මයෙහි විස්තර සඳහන් කරන්න) :—

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | දැරූ තනතුරු | ඇතුළත්වූ දිනය | අස්වූ දිනය | සේවාකාලය අවු. මා. දි. | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|
| | | | | | |

12. යුද සේවාවට බැඳී සිටියේ නම් සේවා කාලය (අස්වීමේ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.

13. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම හා නිලතල සහිත සහතික තුනක පිටපත්, (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය. රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය :————

14. වෙනත් විස්තර :————.

මෙම අයදුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුනා විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ අයදුම් පත්‍රයෙන් යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බව තේරීමට කලින් අනාවරණය වුවහොත් මා මෙම තනතුරට පත්වීමට නුසුදුස්සෙකු බවට පැමිණෙනවා පමණක් නොව, තේරීමෙන් පසුව ඒ බව දැනගන්නට ලැබුණහොත්, කිසිම වන්දි ගෙවීමක් රහිතව, මා රාජකාරියෙන් පහකර දැමීමට යටත් වන බව මම දනිමි.

දිනය :————. ————, අයදුම්කරුගේ අත්සන.

ප්‍රා. අධ්‍යා. අ./ප්‍ර. අ. නි. ගේ නිර්දේශය :
අධ්‍යා. සං./ලේ. (සාප) අංකය :————.

ප්‍රා. අධ්‍යා. අ./ප්‍ර. අ. නි. වෙනුවට.
දිනය :————.

4-158/1—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

10. දැනට යෙදී සිටින රක්ෂාව විස්තර සහිතව (ගුරුවරයෙකු නම් ලියාපදිංචි කළ අංකය, පාඨශාලාවේ නම, දැනට ලබන වාර්ෂික වැටුප, වැටුප් ක්‍රමය හා මීළඟ වැටුප් වැඩිවීමේ දිනය) :————.

11. හස්ත කර්මාන්ත ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දැක්වෙන ෆෝර්ම යෙහි විස්තර සඳහන් කරන්න) :—

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | දරූ තනතුරු | ඇතුළත් වූ දිනය | අස්වූ දිනය | සේවා කාලය අ. මා. දි. | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|
| | | | | | |

12. යුද සේවාවට බැඳී සිටියේ නම් සේවා කාලය (අස්වීමේ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.

13. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් හා නිලතල සහිත සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය. රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය :————.

14. වෙනත් විස්තර :————.

මෙම අයදුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ අයදුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බව තේරීමට කලින් අනාවරණය වුවහොත් මා මෙම තනතුරට පත්වීමට නුසුදුස්සෙකු බවට පැමිණෙනවා පමණක් නොව තේරීමෙන් පසුව ඒ බව දැනගන්නට ලැබුණහොත්, කිසිම වන්දි ගෙවීමක් රහිතව, මා රාජකාරියෙන් පහකර දැමීමට යටත් වන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4–158/2—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### I වෙනි ශ්‍රෙණියේ පාඨශාලා ගොඩනැගිලි වැඩ උප පරීක්ෂක තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ I වැනි ශ්‍රෙණියේ පාඨශාලා ගොඩනැගිලි වැඩ උප පරීක්ෂක තනතුරු සඳහා අයදුම් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ. පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලන ශාඛාවේ ස්ථිර ලේකම් වෙත 1969.4.20 වැනි දින හෝ ඊට පෙර ලැබිය යුතුය.

2. **වැටුප.**—මෙම තනතුරට නියමිත වැටුප් ක්‍රමය රු. 1,860න් පටන් ගෙන රුපියල් 2,820 පෙර කාර්යක්ෂමතා බාධකයක් ඇතිව රු. 120ක වාර්ෂික වැටුප් වැඩිවීම් 16කින් රු. 3,780 දක්වා වේ.

3. **සේවයට බඳවා ගැනීමේ නියමයන් හා සේවා කොන්දේසි.**—(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු අරමුදලට දයක මුදල් ගෙවිය යුතුය. තෝරාගත් අයදුම්කරු අවුරුදු තුනක ආධුනිකත්වයට ද, දැනටමත් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත රජයේ සේවකයෙක් නම් වැඩ බැලීමට ද පත් කරනු ඇත.

(ii) අයදුම්කරු සේවයෙහි තවදුරටත් යෙදීමට නුසුදුසු බව ආධුනික කාල සීමාව ඇතුළත හැඟී ගියහොත්, දැනටමත් රජයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නකු නම්, වැඩ බලන කාලසීමාව ඇතුලත හෝ ආධුනික කාලසීමාව ඇතුලත හෝ එම කාලසීමාව අවසානයේදී හෝ කලින් දැරූ තනතුරට නැවත පත්කරනු ඇත. ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නකු නොවේනම් සේවය නතර කරනවා ඇත.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයන් විසින් ස්ථිර ලේකම්වරයා තීරණය කරන මුදලකට හා ක්‍රමයකට ඇපයක් තැබිය යුතුවේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—(අ) 1969.4.20 වැනි දිනට වයස අවුරුදු 25ට වැඩි හා අවුරුදු 40ට අඩුවිය යුතුයි. දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත වූවන් කෙරෙහි වයස් සීමාව බල පවත්වන්නේ නැත ;

(ආ) උප පරීක්ෂක I වැනි ශ්‍රෙණියට උසස් කිරීමේ විභාගයෙන් සමත්ව ඕවර්සියර් හා/හෝ II වැනි ශ්‍රෙණියේ උප පරීක්ෂක වශයෙන් පස් අවුරුදු සේවා කාලයක් තිබීම ; හෝ

(ඉ) (i) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය ලබා තිබීම ; හෝ

(ii) ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්මික අභ්‍යාස ආයතනයේ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ; හෝ

(iii) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි නිර්මාන ශිල්පය හෝ ගොඩනැගිලි තැනීම හෝ ගොඩනැගිලි ඉංජිනේරු වැඩ පිළිබඳ සන්ධ්‍යා කාල පාඨමාලා සහතිකය ලබා තිබීම ; හෝ

(iv) ඊට සමාන හෝ උසස් කාර්මික සුදුසුකම් ලබා තිබීම ; සහ

(v) ගොඩනැගිලි තැනීමේ කටයුතු හෝ සිවිල් ඉංජිනේරු වැඩ පිළිබඳව යටත් පිරිසෙයින් පස් වසක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබීම.

5. අයදුම්කරුවන් තමන්ගේ ඉල්ලුම් පත්‍ර වලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතික පත්‍රය (සැ.යු.—බව්තීස්ම සහතික හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ කටයුතු සඳහා දෙන ලද සහතික පත්‍ර හෝ භාරගනු නොලැබේ. දැනට සේවයේ සිටින නිලධාරීන් විසින් උප්පැන්න සහතිකය එවීම අවශ්‍ය නැත);

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහ/හෝ වෘත්තීය සුදුසුකම් දක්වන සහතිකය ;

(ඉ) ඉල්ලුම්කරුගේ සුදුසුකම්, චරිතය හා මෙම තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාව සම්බන්ධයෙන් මෑතදී ලබාගත් සහතික පත්‍ර තුනක් (දැනටමත් රජයේ සේවකයෙක් නම් මෙම සහතික එවීම අනවශ්‍යය.)

**සංලක්ෂ්‍යය.**—මෙම සහතික පත්‍ර පිටපත් ආපසු එවනු ලැබේ.

6. ඉහත සඳහන් 4 වැනි ඡෙදයේ ප්‍රකාර සුදුසුකම් ඇති රජයේ සේවකයින්ගේ ඉල්ලුම් පත්‍ර ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුය.

7. ඉල්ලුම් පත්‍ර හෝ මෙම තනතුර පිළිබඳ වෙන කිසියම් ලියුමක් හෝ පෞද්ගලිකව මෙම අමාත්‍යාංශයේ නිලධාරියෙකුගේ නමට නොව ස්ථිර ලේකම් තැන වෙත එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ II ඡෙදයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවයෙහි තනතුරු වලට කරන පත්කිරීම් වලට අදල පොදු කොන්දේසි වලට සැලකිල්ල යොමු කරවනු ලැබේ.

9. මුද්‍රිත අයදුම් පත්‍ර නොමැත. ආකෘති පත්‍ර පහත පෙනෙන ආදර්ශයෙන් පිටපත් කරගත යුතුය.

10. සියලුම අයදුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම්පත් භාරගැනීම අවසන් කොට දෙසතියක් ඇතුලත එසේ දන්වා එවනු නොලැබූ අයදුම්කරුවකු ඒ බව සාමාන්‍ය පරිපාලන ශාඛාවේ ස්ථිර ලේකම් තැන වෙත දන්වා එවිය යුතුය. මෙම නියමය පිළි නොපැදීම අයදුම්කරුවකු සැලකිල්ලට භාජනය වීමට ඇති අයිතිවාසිකම් නැති වීමට ද හේතු වෙනවා ඇත.

ස්ථිර ලේකම්,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය.

සාප/22/123
1969.3.27 වන දින,
කොළඹ 2,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී.

### ආදර්ශ ආකෘති පත්‍රය

### I වැනි ශ්‍රෙණියේ පාඨශාලා ගොඩනැගිලි වැඩ උප පරීක්ෂක තනතුරු

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. 1969.4.20 දිනට නියම වයස :

අවු :————. මාස :————. දින :————.

4. ජාතිය හා ලාංකිකයෙකු වූ අන්දම :————.

5. පහත දැක්වෙන අය උපන් ස්ථානය :

(අ) අයදුම්කරු :————.

(ආ) ඔහුගේ පියා :————.

(ඉ) ඔහුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(ඊ) ඔහුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

6. (අ) කාර්මික අධ්‍යාපනය පිළිබඳ ලැබූ සහතික පත්‍ර :————.

(ආ) කාර්මික අධ්‍යාපනය පිළිබඳ ලත් ප්‍රායෝගික පළපුරුද්ද :—

| උප/ප්‍රාදේශීය කාර්යාලයේ හෝ ආයතනයේ නම | දරූ තනතුර | බැඳුණු දිනය | මාරුවී ගිය හෝ අස්වූ දිනය | අස්වීමට හේතුව | මුළු සේවය අවු. මා. දි. |
|---|---|---|---|---|---|
| | | | | | |

7. පහත සඳහන් භාෂාවන් පිළිබඳ දැනීම :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඉ) ඉංග්‍රීසි :————.

8. ඉගෙනීම ලැබූ පාසැල හා විද්‍යාල :————.

9. දැනට කරන රැකියාව විස්තර සහිතව :————.

10. දැනට ලබන වාර්ෂික වැටුප, වැටුප් ක්‍රමය හා මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

11. යුද්ධ සේවය ඇත්නම් කාලය :————.

12. චරිත සහතික දුන් අය (නෑදෑයන් නොවේ) ගේ නම් හා තනතුරු (චරිත සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය.) රජයේ සේවයෙහි නියුක්ත වූවන්ගෙන් මෙය අනවශ්‍යය :————.

13. වෙනත් තොරතුරු :————.

මා විසින් මෙම අයදුම් පතෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි බව හෝ අසත්‍ය බව පත් කිරීම සඳහා තෝරා ගැනීමට කලින් එළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු වීමටත් පත් කිරීමෙන් පසු එළිදරව් වුවහොත් කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමටත් යටත් වන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

4–158/3—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## අයි. ඇම්. ඇම්. ටී. ඇස්. "ඩ්ෆරින්" නෞකාවේ ආධුනිකත්වය සඳහා ඇබෑර්තු

බොම්බායේ ඇති "ඩ්ෆරින්" නමැති ඉන්දීය වෙළඳ නැවියන් පුහුණු කිරීමේ නෞකාවෙහි 1969 අගෝස්තු මස ඇරඹෙන දෑවුරුදු පුහුණුවීමේ පාඨමාලාව සඳහා විධායක ආධුනිකත්ව තුනකට පුරප්පාඩු ඇත.

2. අවශ්‍ය සුදුසුකම් :—

(i) ඉල්ලුම්කරුවන් ලාංකිකයන් විය යුතුයි.

(ii) 1969 ජූලි මස 1 වැනි දිනට ඔවුන් වයසින් අවුරුදු 15½ ටත් 18 ටත් අතර විය යුතු ය.

(iii) එක් වාරයකදී හෝ ඊට වැඩි වාර ගණනකදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය විභාගයට පෙනී සිට නිර්දේශ පත්‍රයේ "ඒ" හෝ "බී" අනුව ඉංග්‍රීසි භාෂාවෙන් හා ගණිත ශාස්ත්‍රයෙන් (Mathematics) සහ තවත් විෂය යන් 4 කින් සමර්ථවී සිටිය යුතුය.

3. සුදුසුකම් ඇති අපේක්ෂකයින් "ඩ්ෆරින්" විස්තර පත්‍රිකාවෙහි ඇති නිරදේශ පත්‍රිකාව අනුව පහත සඳහන් විෂයයන් සම්බන්ධ යෙන් කොළඹ දී පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු යි :—

ඉංග්‍රීසි භාෂාව.
ගණිත ශාස්ත්‍රය.
භූගෝල විද්‍යාව.
මූලික විද්‍යාව, හා
සාමාන්‍ය දැනීම.

භූගෝල ශාස්ත්‍රය සම්බන්ධයෙන්, ඉන්දියානු හා පකිස්තානු භූගෝල ශාස්ත්‍රය වෙනුවට ලංකා භූගෝල ශාස්ත්‍රය යොදවනු ලැබේ. පරීක්ෂණය ඉංග්‍රීසි බසින් පැවැත්වෙන අතර, ඉංග්‍රීසි, ගණිත ශාස්ත්‍රය (අංක ගණිතය, වීජ ගණිතය, රේඛා ගණිතය හා ත්‍රිකෝණ මිතිය ඇතුළුව) සහ භූගෝල ශාස්ත්‍රය පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. මේ එකිනෙක විෂයය සම්බන්ධයෙන් සාමාර්ථය සඳහා ඉල්ලුම්කරුවන් විසින් සියයට 35 ට නොඅඩු ලකුණු ලැබිය යුතු වේ. පරීක්ෂණය පැවැත්වෙන දිනය හා ස්ථානය පිළිබඳව අපේක්ෂකයින්ට යථා කාලයේදී දැනුම් දෙනු ලැබේ.

4. තැපැල් ගාස්තු හැර පිටපතක් රුපියල් 1.50 ගණනේ වරාය කොමිෂන් සභා කාර්යාලයෙහි විකිණීමට ඇති කායයී විස්තර පත්‍රිකා වෙහි මෙම පුහුණුවීමේ පාඨමාලාව පිළිබඳව සියලුම විස්තර දක්වේ.

5. එකී පාඨමාලාව සඳහා ගාස්තුත්, නිල ඇඳුම්, පොත්, ගමන් ගාස්තු සහ වෙනත් යුක්ති සහගත වියදම් ආණ්ඩුව විසින් දරනු ලැබේ. අනිකුත් සියළු වියදම් ආධුනිකයාගේ දෙමව්පියන් විසින් හෝ ඔහුගේ භාරකරු විසින් දැරිය යුතුය.

6. ප්‍රවාහන අමාත්‍යාංශය මගින් නිකුත් කරනු ලබන විදේශ සාගර යාත්‍රා හෙවත් (Master-Mariner's Foreign-Going) නම් සහතිකය තෝරා ගනු ලබන අපේක්ෂකයා විසින් ලබා, අවුරුදු පහක් ඉකුත්වීමට පෙර ලංකා රජය යටතේ අවුරුදු 5 ක් සේවය කිරීමට ඔහුට නියම කරනු ලැබුවොත් වෙනත් දේ අතර එසේ කිරීමට බැඳෙමින් ඇපකරුවන් දෙදෙනෙකු ඇතිව ඔහු ගිවිසුම කට හා බැඳුම්කරයකට ද ඇතුළත් විය යුතුය. එකී නියමය පිළිපැදී මට යම් පුහුණු වන්නෙක් අපොහොසත් වුවහොත් ඔහු හෝ එසේ නැතහොත් ඔහුගේ ඇපකරුවනුත් පුහුණුව සඳහා රජයෙන් වියදම් කරනු ලැබූ සම්පූර්ණ මුදල ආපසු ගෙවිය යුතුයි.

7. පාඨමාලාව සම්පූර්ණ කළ ආධුනිකයෙකුට රැකී රක්ෂා සපයා දීමට ඉන්දීය රජය හෝ ලංකා රජය ඇප වන්නේ නැත. නමුත් ඔහුව දුම් නැව් සමාගමකට බැඳවීම සඳහා සෑම උත්සාහයක්ම දරනු ලැබේ.

8 ලිඛිත පරීක්ෂණයෙන් සමර්ථ වූ අපේක්ෂකයන් තේරීම් මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටීමට කොළඹට කැඳවනු ලැබේ. තෝරා ගනු ලබන අපේක්ෂකයන්ට බොම්බායේදී පවත්වනු ලබන අක්ෂි පරීක්ෂණයකට හා වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටීමට ඉන්දීය රජය විසින් නියම කරනු ලැබේ. එහි ගිය විට අපේක්ෂකයන් ප්‍රතික්ෂේප කිරීමේ අවදානම අඩුකර ගැනීම සඳහා ඔවුහු දිවයිනෙන් බැහැර යාමට පෙර එවැනිම වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වීමට ලංකා රජය විසින් නියම කරනු ලැබේ. එකී පරීක්ෂණය සඳහා රු. 31.50 ක් අය කරනු ඇත. එකී පරීක්ෂණය තාවකාලික එකක් වන අතර, ඉන්දීය රජය එය හේතුකොටගෙන කිසිම බැඳීමකට ඇතුළත් නොවන බව වටහා ගත යුතු ය.

9. ඉල්ලුම් පත්‍ර මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝර්ම කොළවල විය යුතුය. රුපියල් 10 ක වටිනාකම ඇති මුද්දර එහි අලවා ඉල්ලුම්කරුගේ අත්සනින් ඒවා අවලංගු කළ යුතුය. කිසිම කාරණයක් නිසා හෝ පරීක්ෂණ ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. පහත සඳහන් ලියවිලි ඉල්ලුම් පත්‍රයක් සමග එවිය යුතුය :—

(අ) ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපතක් ;

(ආ) ඉල්ලුම්කරුගේ යහපත් චරිතය පිළිබඳ ඔහුගේ නෑදෑයින් නොවන වැදගත් පුද්ගලයින් දෙදෙනෙකුගෙන් ලබා ගත් සහතික වල පිටපත් ;

(ඇ) රජයේ වෛද්‍ය නිලධාරියෙකුගෙන් ලබා ගත් ඇස් පෙනීම පිළිබඳ සහතිකයක් හා වෛද්‍ය සහතිකයක් ;

(ඈ) අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතික පත්‍රයේ පිටපතක්.

10. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය 1969 මැයි 10 වැනි දින වේ. එදිනට පසු ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත.

සියලුම ඉල්ලුම්පත්‍ර භාරගත් බවට පිළිතුරු සපයනු ලැබේ.

ජනසතු සේවා අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම් වෙනුවට.

ජනසතු සේවා අමාත්‍යාංශය,
තැ. පෙ. නො. 500,
මහ ලේකම් ගොඩනැගිල්ල,
කොළඹ 1. 1969. 3. 27.

වරාය කොමසාරිස් වෙනුවට.

1969 මාර්තු මස 13 වැනි දින,
කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී ය.

## අයි. ඇම්. ඇම්. ටී. ඇස්. "ඩ්ෆරින්" නෞකාවේ ආධුනිකත්වය

### ඉල්ලුම් පත්‍රය

**මෙම ෆෝර්මය සම්පූර්ණ කර 1969 මැයි 10 වැනි දින පස්වරු 4.30 ට පෙර කොළඹ මහ ලේකම් කාර්යාලයේ පිහිටි තැ. පෙ. නො. 500 දරණ ජනසතු සේවා අමාත්‍යාංශය වෙත ලැබිය යුතුයි.**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(පෙළපත් නාම පළමුවෙන් ලිවිය යුතුයි.)

2. ස්ථිර ලිපිනය :————.

3. උපන් දිනය :————.

4. 1969 ජූලි මස 1 වෙනි දිනට වයස :——, අවුරුදු :——, මාස :——, දවස් :————.

5. රටවැසිභාවය හා එය ලැබුණු අන්දම :————.
(ඉල්ලුම් කළ හැක්කේ ලාංකිකයින්ට පමණයි.)

6. උපන් ස්ථානය :—
(අ) ඉල්ලුම්කරු:————.
(ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
(ඇ) ඉල්ලුම්කරුගේ පිය පක්ෂයේ ආතා :————.
(ඈ) ඉල්ලුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :————.

අපේක්ෂකයා සහ ඔහුගේ පියාත් ලංකාවේ උත්පත්තිය ලැබුවා නම් (අ) සහ (ආ) පමණක් පිරවිය යුතුයි. ඉල්ලුම්කරු හෝ ඔහුගේ පියා හෝ ලංකාවෙන් පිටදී උප්පත්තිය ලැබුවා නම් (අ), (ආ), (ඇ) සහ (ඈ) පිරවිය යුතුයි.

7. ආගම :————.

8. ඉල්ලුම්කරු දැනට ඉගෙනීම ලබන පාසැලේ නම සහ ඉගෙන ගත් නා ප්‍රමාණය :————.

9. ඈතුලත් වීමට සුදුසුකම වශයෙන් දක්වා ඇති විභාගය, එය පැවැත් වූ දිනය සහ එයට ගත් විෂයයන් පිළිබඳ විස්තර :—

10. පියාගේ සම්පූර්ණ නම, රක්ෂාව සහ ලිපිනය :————.

11. භාරකරු පියා නොවේ නම් ඔහුගේ නම සහ නෑදෑකම :————.

12. භාරකරුගේ රක්ෂාව සහ ලිපිනය :————.

13. බොම්බායේ දැනට මිතුරෙක් හෝ නෑදෑයෙක් සිටී නම් ඔහුගේ ලිපිනය සහ රක්ෂාව :————.

14. ඉල්ලුම්කරු බාලදක්ෂයෙකු වී සිටියේ ද ? :————.

15. ඉල්ලුම්කරුට පිහනු න්නට හැකි ද ? :————.

> ඉල්ලුම්කරු මෙතැන මුද්දර අලවා ඒමත අත්සන් තබා දැනම යෙදිය යුතුය.
> මුද්දරයේ වටිනාකම රු. 10/—යි.
> ————,

ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

මෙම ඉල්ලුම් පත්‍රයත් සමග පහත සඳහන් ලියකියවිලි එවිය යුතුයි :—

(i) ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපතක් ;

(ii) ඉල්ලුම්කරුගේ යහපත් චරිතය පිළිබඳ ඔහුගේ නෑදෑයකු නොවන වැදගත් පුද්ගලයින් දෙදෙනෙකුගෙන් ලබාගත් සහතිකවල පිටපත් ;

(iii) රජයේ වෛද්‍ය නිලධාරියෙකුගෙන් ලබාගත් ඇස් පෙනීම පිළිබඳ සහතිකයක් හා වෛද්‍ය සහතිකයක් ;

(iv) අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතික පත්‍රයේ පිටපතක්.

වරාය කොමසාරිස් වෙනුවට.

1969 මාර්තු මස 13 වෙනි දින,
කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

3–162–69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

මෙම සංස්ථාවේ පහත සඳහන් තනතුරු සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. මෙහි අවසානයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1969 අප්‍රියෙල් මස 17 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, සේවක මණ්ඩල කළමනාකාර තැන, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, අංක 113, ගාලුපාර, කොළඹ 3 යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

3. මෙම දැන්වීමෙහි සඳහන් අවශ්‍යතාවයනට අනුකූලව පිළියෙල නොවන ඉල්ලුම් පත් කිසිදු දැන්වීමක් නොකර ප්‍රතික්ෂෙප කරනු ලබන අතර, ඉල්ලුම් පත් ලැබුණු බවද දන්වනු නොලැබේ.

4. තෝරාගනු ලබන අයදුම්කරුවන්, ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් ලක්ෂ්‍යයන් මත පත් කිරීමට ඉඩ ඇත.

| තනතුර හා වැටුප් පරිමාණය | අවශ්‍ය සුදුසුකම් |
|---|---|
| **මැකැනික් සී–2 ශ්‍රේණිය** ... 190—290 රු. ———— 5×6 : 7×10 | ... පුහුණු ශ්‍රේණියක මැකැනික්වරයෙකු වශයෙන් අවුරුදු දහය (10) කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය. ඉන් අවුරුදු හත (7) ක පළපුරුද්දක් විශේෂ ආයුධ සහ උපකරණ භාවිතය මගින් ඉන්ධන විදිමේ උපකරණ (තෙල් ඉන්ජෙක්ටර් පොම්ප) මුළුමනින්ම අළුත්වැඩියා කිරීම සහ පරීක්ෂා කිරීම හා සම්බන්ධයෙන් තිබිය යුතුය. අයදුම්කරුවන් ඉන්ධන විදීමේ උපකරණ ඇති පිළිගත් ගරාජයක හෝ අළුත්වැඩියා කිරීමේ වැඩපළක හෝ පළපුරුදුකම් ඇති අයෙකු විය යුතු අතර, පුහුණු ශ්‍රේණියක වැද්දුම් කරුවෙකු වශයෙන් ද සේවය කර තිබිය යුතුය. |
| **වැද්දුම්කරු (තොග නිෂ්පාදන උපකරණ)** ... **සී–2 ශ්‍රේණිය** 190—290 රු. ———— 5×6 : 7×10 | (අ) කියවීමට සහ ලිවීමට හැකියාවක් තිබිය යුතුයි.<br>(ආ) මෙම වෘත්තියේ යටත් පිරිසෙයින් අවුරුදු 10 ක වත් පළපුරුද්දක් තිබිය යුතුයි.<br>(ඉ) '' මයික්‍රෝමීටරයක් '' කියවීමට සහ දශමයක් වාර්තා කර ගැනීමට හැකිවිය යුතුයි.<br>(ඊ) ඛනිජ තෙල් යන්ත්‍රෝපකරණ ක්‍රියා කිරීමේ මූලික ක්‍රමයන් සම්බන්ධව සෑහෙන දැනීමක් ද එවැනි උපකරණවල වැරදි සොයා ප්‍රතිකර්ම යෙදීමට ද හැකිවිය යුතුයි.<br>(උ) එවැනි වැඩට අදාල ඉරි සටහන් තේරුම් ගැනීමට සහ කියවීමට හැකිවිය යුතුයි.<br>(ඌ) නිශ්පාදන පොම්ප, අඟල් 12 හේ විශ්කම්භය ඇති නල මාර්ග සවිකිරීම සහ අළුත්වැඩියා කිරීම ගැන මනා දැනීමක් තිබිය යුතුයි.<br>ඛනිජ තෙල් කර්මාන්තය සඳහා පාවිච්චි කරනු ලබන නොයෙකුත් වර්ගවල වැල්ව (වැල්වස්) අළුත්වැඩියා කිරීමට හැකිවිය යුතුයි. |

සේවක මණ්ඩල කළමනාකාර තැන.

1969 මාර්තු මස

### ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

#### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

1. ඉල්ලුම් කරන ලද තනතුර :————.

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙලපත් නාමය ප්‍රථමයෙන්) :————,

3. මුල් අකුරු සමග නම :————,

4. ලිපිනය :————.

5. උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.) :————.

6. ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස :— අවුරුදු :————. මාස :————. දින :————.

7. පුරවැසි භාවය (උත්පත්තියෙන් ද, ලියාපදිංචි විමෙන්ද යන වග) :————.

8. විවාහක/අවිවාහක බව : අවිවාහක බව :————. විවාහක බව :————. දික්කසාද බව :————.

9. අධ්‍යාපනික පසුබිම :—

| ඉගෙනීම ලැබූ පාඨශාලාවල් | සාමාර්ථය ලැබූ උසස්ම විභාගයන් සහ වර්ෂයන් | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|---|---|
| ................................ | ................................ | ......... | ......... | ......... |
| ................................ | ................................ | ......... | ......... | ......... |
| ................................ | ................................ | ......... | ......... | ......... |

10. වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් තිබේ නම් :————.

11. මීට ප්‍රථම කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර :—

| ආයතනයේ නම | තත්වය | සිට | දක්වා | අස්වීමට හේතු |
|---|---|---|---|---|
| ...................... | ............ | ...... | ......... | ............... |
| ...................... | ............ | ...... | ......... | ............... |
| ...................... | ............ | ...... | ......... | ............... |

12. දැනට ලබන වැටුප :————.

13. විශේෂ සුදුසුකම් ඇත්නම් (ඔබ විසින් හදාරා ඇති ඉගෙනීම/පුහුණුව පිළිබඳ විස්තර සඳහන් කරන්න.) :————.

14. වෙනත් කරුණු :————.

15. මෙම දැන්වීමේ තනතුරු සඳහා " අවශ්‍ය සුදුසුකම් " යටතේ සඳහන් සුදුසුකම්/පළපුරුදුකම් එකිනෙක ඔබට ඇති බව දක්වෙන සටහනක් හා එය ඔප්පු කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් ද අමුණා එවිය යුතු යි.

ඉහත සඳහන් විස්තර සියල්ල නිවැරදි බවත්, සත්‍ය බවත්, සඳහන් කළයුතු කිසිවක් වසන් නොකළ බවත් මෙයින් සහතික කරමි. ඉහත සඳහන් විස්තර අසත්‍ය බව හෝ සැපයිය යුතුව තිබූ විස්තර වසන් කර ඇති බව හෝ තෝරා පත්කර ගැනීමට පෙර ඔප්පු වුනි නම් මගේ ඉල්ලුම් පත්‍රය අවලංගු වන බවද තෝරා ගැනීමෙන් පසුව ඔප්පු වුනි නම් කිසිම වන්දියක් නොමැතිව රැකියාවෙන් පහකරනු ලබන බවද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

4–119/2–69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### පුරප්පාඩු

I, II හා III ශ්‍රේණිවල ක්‍රියාකාරී සහකාර තනතුරු සඳහා ලාංකිකයන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සුදුසුකම්.—

(අ) භාෂාවකින් ලද සම්මාන සාමාර්ථය සහිතව, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන විභාගයක් ; සහ

(ආ) (i) පිළිගත් ආයතනයක සංගීතය පිළිබඳ උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ; හෝ

(ii) නාට්‍ය නිෂ්පාදනයෙහි ලා නිෂ්පාදකයකු වශයෙන් හෝ නළුවකු වශයෙන් හෝ පළපුරුද්ද හා උද්යෝගය ; හෝ

(iii) ප්‍රවෘත්ති පත්‍ර කලාවේදියකු වශයෙන් 5 වසක පළපුරුද්ද.

වයස් සීමාව.—

I ශ්‍රේණිය අවුරුදු 30 කට නොඅඩු විය යුතුයි.

II ශ්‍රේණිය අවුරුදු 25 කට නොඅඩු විය යුතුයි.

III ශ්‍රේණිය අවුරුදු 18 කට නොඅඩු විය යුතුයි.

සටහන.—ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ/ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවකයන් වෙනුවෙන් වයස් සීමා හා අධ්‍යාපන සුදුසුකම් ලිහිල් කිරීමට අවකාශ ඇත.

වැටුප් ක්‍රමය.—

I ශ්‍රේණිය—රු. 400—625 (20 × 5) (25 × 5)
රු. 500 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

II ශ්‍රේණිය—රු. 300—520 (15 × 8) (20 × 5)
රු. 345 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

III ශ්‍රේණිය—රු. 250—400 (10 × 15)
රු. 300 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

මෙම දැන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1969 අප්‍රේල් 15 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර " ක්‍රියාකාරී සහකාර " යන්න පැහැදිලිව ලිවිය යුතුයි.

නෙවිල් ජයවීර,
අධ්‍යක්ෂ ජනරාල්.

1969 මාර්තු මස 22 වැනි දින,
කොළඹ 7.

### නිදර්ශන ආකෘති-පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. ජාතිය :————.
4. අයදුම්කරු උපන් දිනය, ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
5. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
6. අධ්‍යාපනික සුදුසුකම් :—
   සිංහල :————. දෙමළ :————. ඉංග්‍රීසි :————.
7. අමුණා ඇති චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපින (අධ්‍යාපන හා චරිත සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :————.
8. පළපුරුද්ද පිළිබඳ විස්තර හා තෝරා ගැනීමේදී ප්‍රයෝජනවත් වියහැකි වෙනත් විස්තර :————.

මා ඉහතින් ප්‍රකාශ කොට ඇති කරුණු නිවැරදි සත්‍ය තොරතුරු බවත් මා ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවය සඳහා පත්වුවහොත් මවිසින් ඉහතින් සඳහන් කරන්නට යෙදුණ අසත්‍ය හෝ වැරදි තොරතුරක් වෙතොත් ඒ හේතුවෙන් සේවයෙන් පහකිරීමේ දඬුවම් ලැබීමට මා සුදුස්සකු වන බවත් විශේෂයෙන් ම මීට පෙර යෙදී සිටි රැකියාවල් පිළිබඳ හෝ මීට අදාළ වැදගත් කිසියම් කාරණාවක් පිළිබඳව හෝ හිතාමතා වසන් කිරීම නිසා එවැනිම දඬුවමකට මා සුදුසුවන බවත් මා වටහාගත් බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

දිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

4–123–69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

මගේ අංකය : සං ප/5/83.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1 වැනි පන්තියේ විදුලි වැඩකරු තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ 1 වැනි පන්තියේ විදුලි වැඩකරු තනතුරක් සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂක සින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969 අප්‍රේල් මස 20 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ස්ථිර ලේකම් ට ලැබෙන සේ එවිය යුතුය.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—

(i) තනතුර ස්ථිරය. පත් කරනු ලබන්නාගේ විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය 1964.2.7 වැනි දින අංක 633 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ විධිවිධානයන්ට යටත්වනු ඇත. මාසික වැටුප් ක්‍රමයෙහි තැබීමෙන් පසු විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ලැබෙන තුරු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ප්‍රදානය කළ විට වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුයි.

(ii) පත් කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම් පරීක්ෂා කාල සීමාව අවුරුදු 3 ක් වන්නේ ය.

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන්නකු තෝරා ගනු ලැබුව හොත් පත්වීම නියමිත කාලයක වැඩ බැලීමේ හෝ ඈධුනික තත්ත්වයේ පවතිනු ඇත.

(iv) පත් කරනු ලබන්නා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

(v) බඳවා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගිනි.

3. **වැටුප් හා දීමනා :**

(අ) කොළඹ නාගරික සීමාව සහ නාගරික සීමාවේ සිට සැතපුම් 5 ක අරය තුල වූ ප්‍රදේශය තුල හෝ ඉංජිනේරු හා කර්මාන්තශාලීය ආයතනයක් හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු ලැබ ඇති ආයතනවල හෝ සේවය කරන්නවුන් සඳහා :—

පළමු හය මස තුල දිනකට රු. 3.86 බැගින් සහ ඊට පසු වර්ෂයකට රුපියල් 1,170—42×12—1,674.

(ආ) පිට පළාත්වල ඉංජිනේරු හා කර්මාන්තශාලීය ආයතන හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු නො ලැබ ඇති ආයතනවල සේවය කරන්නවුන් සඳහා :—

පළමු හය මස තුල දිනකට රු. 3.30 බැගින් සහ ඊට පසු වර්ෂයකට රුපියල් 1,044—42×8—1,380.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ.

(අ) යටත් පිරිසෙයින් අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(ආ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්තවිය යුතුයි.

(ඇ) (i) කියවීමට හා ලිවීමට හැකියාව තිබිය යුතුය.

(ii) ප්‍රථමාධාර පිළිබඳ පාඨමාලාවක් අනුගමනය කර තිබිය යුතුයි. ප්‍රථමාධාර දීමෙහි ප්‍රවීනතාවක් තිබිය යුතුය.

(iii) 1/64" පරිමාණයක් කියවීමට හා භාගවලින් දක්වෙන දිග පළල ආදිය සටහන් කිරීමට පිළිවන් විය යුතුයි.

(iv) දෝෂ හා ඒවාට හේතු සොයා ගැනීමට හා ඒවාට පිළියම් කිරීමට පිළිවන් විය යුතුයි.

(v) රිලේ, ඒවීආර් හා එබඳු උපකරණ පිළිබඳව දැනීමක් තිබිය යුතුවේ.

(vi) ඇඳීම් හා රූප සටහන් කියවා තේරුම් ගැනීමට පිළිවන් විය යුතුයි.

(ඈ) ඉහත (අ), (ආ), (ඇ) හි සඳහන් සුදුසුකම් වලට අතිරේකව පහත සඳහන් සුදුසුකම් ද තිබිය යුතුයි.

පිළිගත් ආයතනයක පළවෙනි පන්තියේ අදාල වෘත්තීයකරුවෙකු වශයෙන් අවුරුදු 6 කට නොඅඩු සේවයක් සහිතව අදාල වෘත්තීය කරුවෙකු වශයෙන් අවුරුදු 10 කට නොඅඩු සේවයක් තිබිය යුතුයි. (සහතික පත් මගින් සනාථ කළ යුතුයි.)

**සටහන :** එක්සත් රාජධානි කඳවුරුවල වෘතිකයෙකු ලෙස කළ සේවය වශයෙන් පිළිගනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙක්ම සූදානම් විය යුතුය :

(අ) උප්පැන්න සහතිකය හා චරිත සහතික.

(ආ) ලැබූ ඉහළම අධ්‍යාපන සහතිකය.

(ඇ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඈ) 4 වැනි ඡේදයේ (ඈ) අනු ඡේදය යටතේ සඳහන් වන පිළිගත් ආයතනයන්හි පූර්ව සේවය පිළිබඳ සහතික.

(ඉ) සිංහලෙන් හා/හෝ දෙමළෙන් සමත්වූ ඉහළම විභාගය දැක්වෙන සහතිකය.

සටහන—

(i) ලියකියවිලිවත්, ලියකියවිලිවල පිටපත්වත් අයදුම්පතට **අමුණා නොඑවිය යුතුයි.**

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ගැන සළකා බලනු නොලැබේ.

6. අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එසේ නොකළද වුවත්, තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කෙළින්ම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ නමටද එවිය යුතුය. නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් නියම අවස්ථාවේදී දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කළ හොත් පමණක් එසේ ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් බාර ගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

8. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් බාර ගන්නා අවසාන දිනය පසුවී දින 21 ක් ඇතුළත ඉල්ලුම් පත ලැබුණු බවට ලිපියක් නොලද හොත් වහාම ඒ බව අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම් පත්‍රය සළකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 මාර්තු මස 27 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේදී ය.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

### අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය—I වැනි පන්තියේ විදුලි වැඩකරු තනතුර සඳහා ඉල්ලුම් පත්‍රයයි

(සාප/5/83)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ස්ථිර ලිපිනය :————.
3. ගම් ප්‍රදේශය :————.
4. අයදුම් පත් බාර ගන්නා අවසාන දිනට නියම වයස :————.
   උපන් දිනය :————.
5. උපන් ස්ථානය :————.
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.
6. ලාංකිකත්වය පරම්පරාවෙන් ද, ලියා පදිංචි කිරීමෙන් ද යන වග :————.
7. අධ්‍යාපන සුදුසුකම් :————.
   (i) සාමාන්‍ය :————.
   (ii) වෘත්තීය හා/හෝ කාර්මික සහතිකවල විස්තර :————.
   (iii) සිංහලෙන්/දෙමළෙන් සමත්වී ඇති උසස්ම විභාගයේ විස්තර :————.
8. නිවේදනයේ 4 වැනි ඡේදයේ (ඈ) අනු ඡේදය යටතේ සේවා විස්තර :————.
   (සේවය කළ ආයතන, සේවා කාලයන්, ඇරු තනතුර සඳහන් කළ යුතුයි.)
9. **විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————,**

10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම්, (අ) දිනය (ආ) නඩු නොම්මරය (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

11. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නම්, ඔබේ ණයතුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.

12. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර :————.

13. සේවා මුක්ත භටයෙක් වී නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුනු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

14. පාඨශාලාවෙන් අස්වූ දින සිට රැකී රක්ෂා :

(i) දරන ලද තනතුර :————.

(ii) නියුක්තව සිටි වකවානුව :————.

(iii) අස්වීමට හේතුව :————.

15. ආණ්ඩුව යටතේ හෝ පළාත් ආයතනයන් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්,

(අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.

(ආ) සේවයේ යෙදී සිටි කාලය :————.

(ඇ) සේවය නතර කිරීමට හේතු :————.

16. දැනට යෙදී සිටින රක්ෂාව : ආයතනය :————.

(i) තනතුර හා ශ්‍රේණිය :————.

(ii) ඊට පත්වූ දිනය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම්ද :————.

(iv) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(v) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

17. වෙනත් කරුණු :————.

18. මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පලමු සොයා ගනු ලැබුව හොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය.

මගේ අංකය :
ඔබේ අංකය : සා ප/5/83.

අධ්‍ය. සං/ලේ.,

මෙම අයදුම් පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට පසුය/පෙරය.*

ඉල්ලුම් පත්‍රයේ සඳහන්......................අංකිත ඡේදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව්* මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

..................................

..................................

————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
පදවි නාමය :

දිනය :————.

(*අදාල නැති කොටස් කපා හරින්න.)

4–159—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## ලංකා විදේශ දූත මණ්ඩලවල ඇබෑර්තු

### ලිපිකරු තනතුරු—සාමාන්‍ය ලිපිකාර සේවය

1969 මාර්තු 14 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට්පතේ උක්ත කරුණ සම්බන්ධයෙන් පළවූ දැන්වීම හා සම්බන්ධවයි.

ඒ තනතුරු සඳහා අයදුම්පත් භාරගැනීමේ දිනය 1969 අප්‍රියෙල් 20 වන දින දක්වා මෙයින් දීර්ඝ කරනු ලැබේ.

සී. ගුණසිංහම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවටය.

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය,
සෙනෙට් මන්දිරය,
කොළඹ-1.
1969 මාර්තු 27.

4–197—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

මගේ අංකය : 1/83/19 (ජ)

## ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝුලේඛකයින ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ඉංග්‍රීසි)—1968 ඔක්තෝබර්

ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝුලේඛකයින්ගේ II වන කාර්යක්ෂමතා කඩඉමෙන් සමර්ථය ලැබීමේ පරීක්ෂණය සම්බන්ධයෙන් 1968 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වනු ලැබූ සම්මේලන වාර්තා කිරීමේ (ඉංග්‍රීසි) පරීක්ෂණයේ දී පහත නම් සඳහන් ලඝුලේඛක/ලේඛිකාවන් සමත් වී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඔව්හු වාර්ෂික වැටුප රු. 2,940 ක් වීමට පෙර ඇති II වන කාර්යක්ෂමතා කඩඉමෙන් එසෙ කිරීමට දැන් සුදුසුකම් ලබා ඇත්තාහ.

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| කාදර්, අ. ර. අ. | ... | අල්ලස් කොමසාරිස් |
| එදිරිසිංහ, ජ. ල. | ... | මහා භාණ්ඩාගාරය |
| එගම්පරම්, වේ. | ... | කච්චේරිය, ත්‍රිකුණාමලය |
| ප්‍රනාන්දු, තෙ. පි. | ... | දිස්ත්‍රික් උසාවිය, ගාල්ල |
| ප්‍රනාන්දු, ලො. කැ. හැ. | ... | දිස්ත්‍රික් උසාවිය, බදුල්ල |
| හෙන්රි, දි. ල. | ... | ධීවර |
| කෙප්පෙට්ටිපොළ, කිව්. | ... | දිස්ත්‍රික් උසාවිය, මීගමුව |
| මොහමඩ්, මො. හ. සැ. | ... | තක්සේරු |
| නානායක්කාර, තෙ. ප. ගි. | ... | ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවිය, කොළඹ |
| පෙරේරා, ම. හ. වි. | ... | දිස්ත්‍රික් උසාවිය, ගම්පහ |
| රත්නම්, බෙ. සෝ. (මහත්මිය) | | රාජකීය ලංකා ගුවන් හමුදාව |



ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1969 මාර්තු මස 24 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

4–113—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

## උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය | ආහාර ප්‍රමාණය දළවශයෙන් — සේවකයින්ට — මාළු | මස් | කරවල | එළවළු | රෝගීන්ට — මාළු | මස් | කරවල | එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | | | | | | | | | |
| 1. බණ්ඩාරගම මාතෘනිවාසය ... | 100... | 400 | 1969.4.18 පෙ.ව. 10.00ට | 150... | 139... | 146... | 642... | 63... | 61... | 65... | 272 |
| 2. බුලත්සිංහල මාතෘනිවාසය ... | 100... | 300 | | 275... | 266... | 248... | 1,140... | 399... | 424... | 386... | 1,708 |
| 3. වාද්දුව මාතෘනිවාසය ... | 100... | 300 | | 54... | 58... | 52... | 218... | 78... | 91... | 77... | 313 |
| 4. පනාපිටිය මාතෘනිවාසය — | 100... | 200 | | 24... | 20... | 10... | 25... | 10... | 20... | 18... | 36 |

4-66—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

කොළඹ, තැ. පෙ. අංක 1434රේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ආනමඩුව රෝහලේ ප්‍රා. සෞ. නි. නිවාසයේ බැල්දි වැසිකිළි ජල මුද බවට පරිවර්තනය කිරීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් 1969 මැයි මස 6 වන අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7 පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැන ගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝරම්වල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැන විසින් 1969 අප්‍රේල් මස 25 වන සිකුරාදා පස්වරු 4 වන තෙක් නිකුත් කරනු ලබන්නේ පල්දෝරු ක්‍රම ඉදිකිරීම සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ "ඊ" කොටස යටතේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ට පමණි. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැනගේ නමට අය වන ලෙස කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රුපියල් 25 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු ය.

3. ටෙන්ඩර්පත් ලබා ගැනීම වෙනුවෙන් මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කොට ඇති පහත සඳහන් සංගම්වලට ද ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කොට ඇති ග්‍රාම සංවර්ධන සමිති.

(ඇ) සමූපකාර සමාගම් රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කොට ඇති සමූපකාර සංගම්.

4. ටෙන්ඩර්පත් කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු කාර්යාලයේ තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් ලියාපදිංචි කළ තැපෑලෙන් ඇවිය යුතුය. ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන් ගේ නියෝජිතයින් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ ටෙන්ඩර්පත් පිළිගැනීමේ බලය ලබා ඇති නිලධරයෙකුට භාර දිය හැකි ය. සේවයේ විස්තරද, ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ලිපිනය ද, කවරයේ සඳහන් කළ යුතු ය. ටෙන්ඩරය භාරගත් බවට ඉහත සඳහන් නිලධාරිතැන විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

5. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී නියමිත දින එකී වේලාවට කෙරෙනු ටෙන්ඩර් විවෘත කිරීමේ දී සෑම ඉල්ලුම්කරුවෙකුට ම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර්කරුවන් ගේ නම් සහ මිල ගණන් පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි දී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන්ගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර්කරුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

6. මෙම වැඩයට උවමනා සිමෙන්ති ප්‍රමාණය මිලදී ගැනීමට අවශ්‍ය අවසර පත්තරය ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයෙන් හෝ සමූපකාර තොග වෙළඳ ආයතනයෙන් හෝ ලබා ගැනීම සඳහා නියමිත නිර්දේශය සාර්ථක ටෙන්ඩර් කරු වෙත නිකුත් කරනු ලැබේ.

7. මෙම වැඩය සඳහා අවශ්‍ය, මෙ රටින් ලබා ගත නොහැකි බඩු බාහිරාදිය ආනයනය කිරීම සඳහා බල පත්‍ර ලබා ගැනීම ද නිර්දේශ කරනු ලැබේ.

8. වැඩය පිළිබඳ තව දුරටත් විස්තර කොළඹ 7, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

අෆ්. ඊ. ජේ. මේනරී,
ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන.

1969 මාර්තු මස 24 වනදා,
කොළඹ 7, තැ. පෙ. 1434 දී.

4-65—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—වවුනියා උපකොටස

වවුනියා උප කොට්ඨාශයට අයත් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් උතුරු කොට්ඨාශය භාර, වවුනියාවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 අප්‍රියෙල් 26 වෙනි සෙනසුරාද පෙරවරු 10.00 දක්වා බාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ගණන්වලට ලියා පදිංචි වී ඇති, ලාංකික වූ කොන්ත්‍රාත්කරුවන්, සමූපකාර සමිති හා ග්‍රාමසංවර්ධන සමිති පමණක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් එවීමට සුදුස්සෝ වෙති.

| වැඩ විස්තරය | අවශ්‍ය ලියා පදිංචි මුදල | ටෙන්ඩර් ඇප මුදල | දෙපාර්තමේන්තුව විසින් සපයන ද්‍රව්‍ය |
|---|---|---|---|
| 1. තොත්තන්කුලම ඉදිකිරීම ... ... | රු. 50,000 | හෝ ඊට වැඩි රු. 100 ... | සිමෙන්ති පමණයි |
| 2. පෙරියකඩවු වැව වැඩි දියුණු කිරීම හා ගංවතුරින් වූ හානි අලුත්වැඩියා කිරීම | රු. 25,000 | හෝ ඊට වැඩි රු. 50 ... | සිමෙන්ති සහ බී. ආර්. සී. පැබ්රික් පමණයි |

3. 1969.4.22 වෙනි දින තෙක් කාර්යාල වේලාවන් තුළදී වවුනියාව, වවුනිකුලම, මුලතිව්, යාපනය, මන්නාරම සහ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වලින් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් හා දනට ඔවුන් දෙපාර්තමේන්තුවේ කරන වැඩ සහ ඒවායේ වටිනාකම් දක්වන ප්‍රකාශයන්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

4. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ඉහත නියමිත කළ පරිදි තැන්පත් මුදලක් ඉහත සඳහන් වාරිමාර්ග කාර්යාල හෝ කච්චේරියක වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවෙන් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

ඉහත සඳහන් ද්‍රව්‍ය පමණක් වවුනියාවේ දෙපාර්තමේන්තු මහා ගබඩාවෙන් සපයනු ලැබේ. මීට අමතරව වෙනත් උපකරණ සහ ද්‍රව්‍ය මේ වැඩ සඳහා සපයනු නොලැබේ.

6. මේ සඳහා වැඩි විස්තර වවුනියා උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයෙන් කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැක.

එස්. ඕ. ඒ. සෝමනාදර්,
වාරිමාර්ග ඉංජිනේරු,
වවුනියා උප කොට්ඨාශය.

වවුනියාව,
1969.3.21.

4-51—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වර්ෂ 1969 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලය තුළ නුවර එළිය, හපුතලේ සහ මහනුවර දිස්ත්‍රික්කවල "සින්කෝනා" පොතු එකතු කිරීමේ වරප්‍රසාදය මිළයට ගැනීමේ ටෙන්ඩර් වර්ෂ 1969 අප්‍රේල් මස 18 වන සිකුරාදා පෙ. ව. 10 වන තෙක් කොළඹ 2, අංක 9, කිව් පාරේ පිහිටි පර්යේෂණ හා අධ්‍යාපන අංශයේ වැඩ බලන වන සංරක්ෂක විසින් භාරගනු ලැබේ.

එදිනම පෙ. ව. 11ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. සෑම ටෙන්ඩර් අයදුම් පතක් නිකුත් කිරීමට ප්‍රථම රු. 25 තැන්පත් මුදලක් වන සංරක්ෂක තැනගේ නමින් කොළඹ 1, යෝක් විදියේ, ලංකා බැංකුවේ වන සංරක්ෂක තැනගේ ගිණුම් අංක 34 යටතේ තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක් ටෙන්ඩර් අයදුම්පත් ලබා ගැනීමේදී ඉදිරිපත් කළ යුතුය. කලින් දින ප. ව. 4 තෙක් පමණක් ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කරනු ලැබේ.

සියළු විස්තර හා කොන්දේසි කොළඹ 2, අංක 9, කිව් පාරේ පිහිටි, පර්යේෂණ හා අධ්‍යාපන අංශයේ වන සංරක්ෂකගේ කාර්‍යාලයෙන් හෝ නුවරඑළියේ, උඩරට දිසාවේ, දිසා වන නිලධාරිගෙන් හෝ ලබාගත හැක.

ඒ. ඊ. කේ. තිස්සවීරසිංහ,
වැඩ බලන වන සංරක්ෂක වෙනුවට.

පර්යේෂණ හා අධ්‍යාපන ශාඛාව,
අංක 9, කිව් පාර,
කොළඹ 2,
1969 මාර්තු 27 දින.

4–114—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**පොලොන්නරුව උප කොටස—ස්ථිර ඕවර්සියර් නිවාසයක් ඉදිකිරීම —සී. ටී. 3**

1969. 3. 14 වෙනි දින අංක 14,845 දරන රජයේ ගැසට් පත්‍රයෙහි පලකරන ලද දැන්වීම ගැනයි.

මෙම සේවාව සඳහා ටැන්ඩර් භාර ගන්නා අවසාන දිනය 1969 අප්‍රේල් මස 18 වෙනි දින පෙරවරු 10.00 දක්වා දීර්ඝ කර ඇත.

වාරිමාර්ග ඉංජිනේරු,
පොලොන්නරුව උ. කො.

වාරිමාර්ග කාර්යාලය,
පොලොන්නරුව, 1969. 3. 22.

4–45—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**අනුරාධපුර උප කොටස**

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නාච්චාදූව ව්‍යාපාරයේ, ශ්‍රාවස්ති වත්තේ 18 කුඹුරු ඇල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අනුරාධපුර උතුරු මැද කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969.4.26 වෙනි සිකුරාදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් අයදුම් පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 27,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිති වලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

3. 1969.4.22 වෙනි දින දහවල් 12 දක්වා කාර්යාලීය වේලාවන් තුලදී අනුරාධපුරය/පදවිය/මහකනදරාව/රාජාංගනය යන වාරිමාර්ග කාර්යාල වලින් ලබා ගත හැකි ටෙන්ඩර් ෆෝර්ම වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුය. ටෙන්ඩර්ෆෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ සහ ඒවායේ වර්තමානකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර මෙම වැඩය සඳහා රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉහත සඳහන් කාර්යාල වල හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම වැඩය ගැන සියළුම විස්තර සැලසුම් ආදිය කාර්යාල වේලාවන් තුලදී අනුරාධපුර වාරිමාර්ග කාර්යාලයෙන් ලබා ගත හැක.

ඩබ්ලිව්. එස්. සහාරත්නම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
අනුරාධපුර උප කොටස.

4–109—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**පොලොන්නරුව මධ්‍යම සත්ව පර්යේෂණ මධ්‍යස්ථානයේ 1වී වර්ගයේ නිවාස 5 ක් තැනීම**

පොලොන්නරුව මධ්‍යම සත්ව පර්යේෂණ මධ්‍යස්ථානයේ ඉහත සඳහන් ගොඩනැගිල්ල තැනීම සඳහා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969.4.29 වෙනි දින පස්වරු 2.30 වනතුරු ටෙන්ඩර් භාරගනු ලැබේ.

කොළඹ 3, ගාලු පාරේ අංක 457 දරණ ස්ථානයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) තැනගෙන් ලබා ගත හැකි ෆෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන් විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබාගත හැක.

3. ටෙන්ඩර්කරුවන් රුපියල් 75,000 කට ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් රජයේ දෙපාර්තමේන්තුවක හෝ ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලිය කියවිලි ඉදිරිපත් කළ විට 69.4.18 වෙනි දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ:—

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියා පදිංචි කිරීමේ ලියවිල්ලක්.

(ආ) රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් විදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969.3.23 වෙනි දින,
කොළඹ 3, ගාලු පාරේ,
අංක 457 දරණ ගොඩනැගිල්ලේ
පිහිටි සිවිල් ඉංජිනේරු කාර්යාලයේ දීය.

4–60—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**සීතාඑළිය අර්තාපල් ගොවිපලේ (නුවරඑළිය) පර්යේෂණාගාරයක් තැනීම**

සීතාඑළියේ ඉහත සඳහන් ගොඩනැගිලි තැනීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969.4.29 වෙනි දින පස්වරු 2.30 වනතුරු ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. කොළඹ 3, ගාලු පාරේ අංක 457 දරන ස්ථානයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) තැනගෙන් ලබාගත හැකි ෆෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන් විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබාගත හැක.

3. ටෙන්ඩර්කරුවන් රුපියල් 2,00,000 කට ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් රජයේ දෙපාර්තමේන්තුවක හෝ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1969.4.18 වෙනි දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ ලියවිල්ලක්,

(ආ) රු. 250 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරන ගිණුමට බැර කරමින් කොළඹ යෝක් විදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969.3.23 වෙනි දින,
කොළඹ 3, ගාලු පාරේ,
අංක 457 දරන ගොඩනැගිල්ලේ
පිහිටි සිවිල් ඉංජිනේරු කාර්යාලයේ දී ය.

4–90—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ටෙන්ඩර් අංකය : සී. ඊ. 686904

ධාන්‍ය වියලන යන්ත්‍ර සවි කිරීම—ගිඟුරක්ගොඩ හා පොළොන්නරුව කෘෂිකර්ම ස්ථානය

ඉහත සඳහන් කාරණය සම්බන්ධයෙන් අංක 14,842 සහ 21.2.69 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් කැඳවන ලද ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය 20.4.69 වෙනි දින ප. ව. 2.30 තෙක් ද, ටෙන්ඩර් පෝරම නිකුත් කිරීම 18.4.69 වෙනි දින දවල් 12 තෙක් ද දීර්ඝකොට ඇත.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

3.4.69 වෙනි දින,
පේරාදෙනියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

4–96—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව—මොණරාගල දිස්ත්‍රික්කය

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීම

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන් හා විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියා පදිංචි වී ඇති අනිකුත් සමුපකාර සමිති වලින් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

**වැල්ලවාය ග.ව.නි. කොට්ඨාශය**

1. මහවෙල ඇල කුඹුක් ආර අමුණ තැනීම.
2. මල්අත්තාවෙල ඇල දියුණු කිරීම.
3. සාලබෝව ඇල කර්මාන්තය.
4. තෙලුල්ල වැව දියුණු කිරීම.

**බුත්තල ග.ව.නි. කොට්ඨාශය**

5. කුකුරම්පොල අඹගහ කුඹුරේ වතුර බෙදීමේ කර්මාන්තය.
6. කුකුරම්පොල දිය බෙදීමේ පෝටාව තැනීම.

**බඩල්කුඹුර ග.ව.නි. කොට්ඨාශය**

7. තලගහ අරාව පිහිල්ල තැනීම.
8. තහන්තඩ ඇල අළුත් වැඩියාව.
9. යාකුරාව ඇල අළුත් වැඩියාව.

**මඩුල්ල ග.ව.නි. කොට්ඨාශය**

10. ඔබ්බෙගොඩ අලගහ අරාව අමුණ තැනීම.
11. ඔබ්බෙගොඩ ඔද්දඹවෙල අමුණ තැනීම.
12. මාගන්දන සුන්දර ආර අමුණ තැනීම.
13. මාගන්දන මියනකඳුර ආර අමුණ තැනීම.
14. මකුලල තම්පලාවෙල අමුණ තැනීම.
15. බදුලුවෙල දන්දෙනවෙල අමුණ තැනීම.

**මැදගම ග.ව.නි. කොට්ඨාශය**

16. තත්කපුරාවේ දලවගල්ල රෙගුලේටරය තැනීම.
17. පුඹඳුමුල්ල ඇල තැනීම.
18. පොල්වත්ත ඇල දියුණු කිරීම.
19. දික් අරාවේ අමුණ තැනීම.

**දොඹම්ගොල්ල ග.ව.නි. කොටස**

20. පදිප්පලන්මුල්ල ඇල දියුණු කිරීම.
21. කැබැල්ලගොඩේ දියබෙදුම තැනීම.
22. හෙල අස්වැද්දුමේ දිය බෙදුම තැනීම.

**බිබිල ග.ව.නි. කොටස**

23. ඊතනවත්ත ඇල II කොටස දියුණු කිරීම.
24. පතිනාවෙල ඇල දියුණු කිරීම.
25. කුරුඅඹේ ඇල බැම් බැඳීම.
26. දෙඹරතැන්නේ අමුණු අළුත් වැඩියාව.

**මහඔය ග.ව.නි. කොටස**

27. පලතුරු වැල්ල අමුණට ලෑලි සැපයීම.
28. නිල්ලඹ ඇල දියුණු කිරීම.
29. මොණරාගල ගොවිජන සේවා කායාලයේ ජීප් රථ දමීමේ ගරාජය තැනීම.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර වලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 අප්‍රියෙල් මස 26 දින දවල් 12 දක්වා මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ වම් කෙළවරේ "මොණරාගල දිස්ත්‍රික්කයේ සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 අප්‍රියෙල් මස 27 දින දවල් 12 ට පෙර මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරී තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමඟ ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවහොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුලත් කළ යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලබන කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුලත් විය

කොන්ත්‍රාත්තුවේ මෙම කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරු යම් විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට එයම හේතුවිනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තුමාගේ එකඟත්වය ඇතිව, නිශ්චිත ලියවිල්ලකින් එකී බලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්තකරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිසි.

එවැනි ලිඛිත බලයක් හෝ එකඟත්වයක් නැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම්වන අතර, එය කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙකු අදහස් කැරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් බවයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සැම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන්නාවූද සහ මිත්මතු ක්‍රියාත්මක වියහැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද, වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟවිය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලබන කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පොත් පත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් ලෙස බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂාකිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

7. ජයග්‍රාහී කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුවේ වැඩ කරගෙනයන අතරතුරදී කොටස් මුදල් ලබාගැනීමට අවශ්‍යවුවහොත්; එවැනි අවස්ථාවලදී කරනලද වැඩවලින් සියයට හැත්තෑපහකට සරිලන ප්‍රමාණයේ කොටස් මුදල් ලබාගත හැකිවේ.

8. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉල්ලුම් පතක් මඟින් හම්බන්තොට දිසාපතිගෙන් ලබාගත හැකිසි.

ඒ. ඩබ්ලිව්. ඩී. පෙරේරා,
හම්බන්තොට දිසාපති වෙනුවට.

1969 ක්‍රි. ව. මාර්තු මස 23 වන දින,
හම්බන්තොට කච්චේරියේ දීය.

4-59—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### ජිස් සිමෙන්ති මළු හා පරණ ප්‍රවෘත්ති පත්‍ර මිලයට ගෙන ඉවත ගෙනයාම

පමගි පහත සඳහන් ද්‍රව්‍ය මිලයට ගෙන ඉවත ගෙන යාම සඳහා, පොළොන්නරුව ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1969.4.22 වැනි දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

1. ගිස් සිමෙන්ති මළු 10,000.

2. පරණ ප්‍රවෘත්ති පත්‍ර රාත්තල් 638.

2. පොළොන්නරුව, ඉඩම් සංවර්ධන නිලධාරීගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල මිල ගණන් ඉදිරිපත් කළ යුතු ය. අනුමත පෝර්මවල නොවන මිල ගණන් සලකා බලනු නොලැබේ. මෙම කායාලයේ හෝ ඕනෑම කච්චේරියක රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ හොත් පමණක්, 1969.4.21 වැනි දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. මිල ගණන් පිළිගත් බව දැනුම් දීමෙන් පසු, දින දහයක් ඇතුළත ද්‍රව්‍ය සඳහා ඉදිරිපත් කරන ලද වටිනාකම සම්පූර්ණයෙන්ම තැන්පත් කිරීමට නොහැකිවූ හෝ පැහැර හරින ලද හෝ අයගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක කරනු ලැබේ.

4. සාර්ථක වූ ටෙන්ඩර්කරු, වටිනාකම තැන්පත් කර දින තුනක් ඇතුළත අදාළ ද්‍රව්‍ය ගබඩාවෙන් පිටතට ප්‍රවාහණය කර ගැනීමට කටයුතු යොදා ගත යුතු ය.

5. කිසිදු විමසීමක් නොමැතිව, සියළුම මිල ගණන් හෝ කොටසක් හෝ ප්‍රතික්ෂෙප කිරීමට පොළොන්නරුව, ඉඩම් සංවර්ධන නිලධාරීට සම්පූර්ණයෙන්ම අයිතිය ඇත.

6. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම බහා එවන කවරය වම්පස කෙළවරේ "ජිස් සිමෙන්ති මළු හා පරණ ප්‍රවෘත්ති පත්‍ර මිලයට ගැනීම සඳහා මිල ගණන්" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ පොළොන්නරුව ඉඩම් සංවර්ධන කාර්යාලයේ ඉඩම් සංවර්ධන නිලධාරීන්ගේ කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම හෝ කළ හැකි ය.

7. මාගේ ප්‍රාදේශිය ගබඩාවේදී කායාලීය වේලාවන් ඇතුලත මෙම ද්‍රව්‍ය පරීක්ෂාකර බැලිය හැකි ය.

8 1969.4.22 දින පෙරවරු 11.30 ට ටෙන්ඩර් විවෘත කරන අතර, එම අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

9. තව ද, වැඩි විස්තර කායාලීය වේලාවන් ඇතුලත පොළොන්නරුව, ඉඩම් සංවර්ධන නිලධාරීගෙන් ලබාගත හැකි ය.

එෆ්. බී. ආර්. ද සිල්වා,
ඉඩම් සංවර්ධන නිලධාරි,
පොළොන්නරුව.

1969 මාර්තු මස 12 වැනි දින,
පොළොන්නරුව ඉඩම් සංවර්ධන කාර්යාලයේ දී.

4-56—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ:—

**ගල්බොඩ කෝරළය**

| | | |
|---|---|---|
| 1. | දෙල්දෙනියේ අමුණ සෑදීම ... ... | 280 |
| 2. | හැවන්දෙනිය ඇල අමුණ සෑදීම ... ... | 283 |
| 3. | ගල්ගොඩේ අමුණ සෑදීම ... ... | 318 |
| 4. | නොටපොලදෙනිය අමුණ සෑදීම ... ... | 762 |
| 5. | පාහිංගමුවදෙනියේ අමුණ සෑදීම ... ... | 784 |
| 6. | දෙල්ගහදෙනිය කඩාවුව සෑදීම ... ... | 785 |
| 7. | සෙම්බුදෙනිය අමුණ සෑදීම ... ... | 787 |
| 8. | පොල්කටුගොල්ල අමුණ අළුත්වැඩියාව ... ... | 971 |
| 9. | බණ්ඩාර ඇල අමුණ නල මාර්ගය සෑදීම ... ... | 983 |
| 10. | වැලිකුඹුර අමුණ සෑදීම ... ... | 1010 |
| 11. | ගල්වලමුල්ල අමුණ සෑදීම ... ... | 1024 |
| 12. | වලව්වේ අමුණ සෑදීම ... ... | 1056 |
| 13. | ලංකාවර්න කුඹුරට බැම්මක් බැඳීම ... ... | 1542 |
| 14. | ගල්අස්සදෙනිය ඇලබැම්ම බැඳීම ... ... | 1544 |
| 15. | රද්දල අමුණේ ඇලවේල්ල සෑදීම ... ... | 123 |

**පරණකුරු කෝරළය**

| | | |
|---|---|---|
| 16. | සියඹලාපිටියේ අමුණ සෑදීම ... ... | 125 |
| 17. | කුකුල්පිටිය අමුණ අළුත්වැඩියාව ... ... | 194 |
| 18. | අඹවෙල වෙල්යාය අමුණ අළුත්වැඩියාව ... | 687 |
| 19. | පරකොස්ගොල්ල වේල්ල සෑදීම ... ... | 946 |

**බෙලිගල් කෝරළය**

| | | |
|---|---|---|
| 20. | බලේවල අමුණ අළුත්වැඩියාව ... ... | 849 |
| 21. | පිහිඹියේ අමුණ සෑදීම ... ... | 20 |
| 22. | දෙල්ගස්දෙනිය අමුණ අළුත්වැඩියාව ... ... | 45 |
| 23. | තම්බැවිල අමුණට ලැලි සැපයීම ... ... | 642 |
| 24. | වට්ටාරම අමුණේ හොරොව්ව අළුත්වැඩියාව ... | 872 |
| 25. | හොන්නැස්ස ඇල අමුණ සෑදීම ... ... | 898 |
| 26. | මැදපැල කුඹුරේ පැතිබැම්ම සෑදීම ... ... | 901 |
| 27. | පුරන කුඹුර අමුණ සෑදීම ... ... | 906 |
| 28. | ගල්කැටියේ අමුණ සෑදීම ... ... | 907 |
| 29. | හෙට්ටිඅස්සැද්දුම පැතිබැම්ම සෑදීම ... ... | 909 |
| 30. | අලිගලවත්තේ පැතිබැම්ම බැඳීම ... ... | 910 |
| 31. | පට්ටපැල අමුණ සෑදීම ... ... | 1156 |

**දෙනිගම්පල් කෝරළේ හා පාත බුලත්ගම**

| | | |
|---|---|---|
| 32. | ගෝනගල, දෙරකඩ කුඹුර අමුණ සෑදීම ... ... | 464 |
| 33. | කෙතේකුඹුර ආරක්ෂක බැම්ම කඩායාම සෑදීම ... | 791 |

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

**පූර්ව මිශ්‍රණ වැඩ සඳහා ⅜" යන්ත්‍රයකින් කඩනලද වර්ගකල හැකි කලුගල් සැපයීම සහ ගෙනැවිත් භාරදීම**

කොළඹ-ගාල්ල පාරේ 58 වැනි සැතපුමෙහි පූර්ව මිශ්‍රණ වැඩපලට ⅜" යන්ත්‍රයකින් කඩනලද වර්ගකල හැකි කලුගල් කියුබ් 1,800 ක් ගෙනැවිත් භාරදීම සඳහා ටෙන්ඩර් පත් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් 1969 අප්‍රේල් මස 27 වන ඉරිදා පෙරවරු 11 වනතෙක් භාරගනු ලැබේ.

1969 අප්‍රියෙල් මස 27 පෙරවරු 11.05 ට ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක. ටෙන්ඩර් ලියවිලි ඇල්පිටියේ විධායක ඉංජිනේරු කාර්යාලයේදී පරීක්ෂා කල හැක.

රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 250ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කර ඇල්පිටියේ විධායක ඉංජිනේරුතැනගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතනවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතැන විසින් අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති.

(ඇ) සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කල සමූපකාර සමිති.

මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් දෙපිටපතකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. 1969 අප්‍රියෙල් මස 11 වැනි සිකුරාදා දවල් 12 වනතෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාදවී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු නොගෙවන ගාස්තුවක් නිකුත් කරන නිලධාරිතැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුය.

ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ලාංකිකයින්ට හා ලාංකික වෙළඳ සහ අනිකුත් සමාගම්වලට සීමාකර තිබේ.

එස්. සෙල්ලදුරෙයි,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ දීය.
1969 මාර්තු මස 24 දින,

4–154—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

**මැඩුණු පිත්තල පොලු (Extruded Brass Bars) සහ මෘදු වානේ පොලු සැපයීම**

ඉහත සඳහන් දෑ සැපයීම උදෙසා 1969 ජූනි මස 1 දින පෙ. ව. 10 වන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත් මෙම කායසීලයෙන් හෝ කොළඹ 5, හැව්ලොක් පාරේ අංක 242 වෙනි ස්ථානයේ පිහිටි අපගේ ප්‍රධාන කායසීලයෙන් හෝ ආපසු ගෙවන රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් හා ආපසු නොගෙවන රු. 25 ක ටෙන්ඩර් ගාස්තුවක් ගෙවීමෙන් ලබා ගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් 1969 ජූනි මස 1 වෙනි දින දහවල් 12 ත් පසුව භාරගනු නොලබන අතර, ටෙන්ඩර් පත් ටෙන්ඩරය අවසාන වන දින නිකුත් කරනු නොලැබේ. ටෙන්ඩර් පත් මෙම කායසීලයෙහි හා ප්‍රධාන කායසීලයෙහි පරිශලනයට තබා ඇත. අවලංගු කරන ලද ටෙන්ඩර් පත් හා සැලසුම් රුපියල් 25 බැගින් ගෙවීමෙන් ලබා ගත හැක.

මිලට ගැණුම් නිලධාරී.

ලං. රා. ලෝ. සං., ලෝහ භාණ්ඩ කම්හල, යක්කල.

4–40—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 අප්‍රේල් මස 25 වැනි දින පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩෙහි ස්වභාවය |
|---|---|
| 1. කු/කුරුණෑගල කණිෂ්ඨ කාර්මික විද්‍යාලය | ... කර්මාන්තශාලා ගොඩනැගිල්ල |

**සංක්ෂෙපය.**—කු = කුරුණෑගල දිස්ත්‍රික්කය.

කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ විදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1 රු. 90,000 හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 අප්‍රේල් මස 23 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාර දීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ විදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් ලබාගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් කොළඹ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වෙත භාර දිය යුතුය. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 අප්‍රේල් මස 25 වැනිදා පෙරවරු 10:30 ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගත වන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තරයක් වෙතොත් කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

බී. එස්. කළුගම්පිටිය,
කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 මාර්තු මස 23 දින,
කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ දී ය.

4–105—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

## හූඩිස් මැටි සහ නිරුවානා වැලි සැපයීම සඳහා ටෙන්ඩර්

ඉහත සඳහන් දෑ සැපයීම උදෙසා 1969.4.11 දින උදේ 10 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයෙන් හෝ කොළඹ 5, හැව්ලොක් පාරේ අංක 242 වෙනි ස්ථානයේ පිහිටි අපගේ ප්‍රධාන කාර්‍යාලයෙන් හෝ ආපසු ගෙවිනු රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් හා ආපසු නොගෙවන රු. 5 ක ටෙන්ඩර් ගාස්තුවක් ගෙවීමෙන් ලබාගත හැක.

ටෙන්ඩර් කොන්දේසි හා ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ හා අපගේ ප්‍රධාන කාර්යාලයේ පරිශීලනයට තබා ඇති අතර, අවලංගු කරන ලද ටෙන්ඩර් පිටපත් රුපියල් 5 බැගින් ගෙවීමෙන් ලබා ගත හැක.

මිලට ගැනුම් නිලධාරී.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
ලෝහ භාණ්ඩ කම්හල, යක්කල.

4–98—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

යෝජිත ක්‍රීඩා ශාලාව, ගරාජය සහ ගබඩාව. සැනෙට් ගොඩනැගිල්ල, කොළඹ 1 සඳහා වූ ටෙන්ඩර් පත්, ර. වැ. දෙ. අධිකාරි ඉංජිනේරු (ගො) කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 අප්‍රේල් මස 23 වැනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ.

2. ගොඩනැගිලි බටහිර, කොළඹ 7, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රු. 47,000කට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය වර්ෂ 1969 අප්‍රේල් මස 11 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. "ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, ඇතට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය."

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

පී. නඩරාජා,
අධිකාරී ඉංජිනේරු, ගොඩනැගිලි.

අධිකාරී ඉංජිනේරු ගොඩනැගිලි කාර්යාලය,
ටොරිංටන් චතුරශ්‍රය. කොළඹ 7,
1969. 3. 22.

4–46—69.4.3 දන අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1968–69 වර්ෂය සඳහා ක්‍රීඩා භාණ්ඩ සැපයීම

රජයේ පාසල්වලට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ සැපයීම සඳහා කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින් 1969 අප්‍රේල් මස 26 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර, පූර්වෝක්ත 1 ඡේදයෙහි සඳහන් වන දිනයෙහි එකී වේලාවට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේදී විවෘත කෙරෙනු ඇත.

3. ටෙන්ඩර්, නියමිත ආකෘති පත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතුය. එම ආකෘති පත්‍ර 1969 අප්‍රේල් මස 25 වැනි දින පස්වරු 4.30 දක්වා කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් (සැපයීම් ශාඛාව) ගේ කාර්යාලයේදී ලබාගත හැකිය.

4. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්තවිය යුතුය. ටෙන්ඩර පත්‍ර බහා එවන කවරයෙහි වම් පස මුදුන් කෙළවරේ "ක්‍රීඩා භාණ්ඩ සැපයීම—1968–69 සඳහා ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර පත්‍රය"යි යනුවෙන් සටහන් කළ යුතුය.

5. ලියාපදිංචි කළ තැපැල් මගින් ද ටෙන්ඩර පත්‍ර එවිය හැකිය. කිසියම් ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවෙක් ස්වකීය ටෙන්ඩරය මේ අයුරින් එවීමට කැමති නොවන්නේ නම් එවිට එම ටෙන්ඩර මුද්‍රා තබා පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයකු මගින් හෝ ටෙන්ඩර පිළිගැනීමට හා ඒවා ලැබුණු බව දන්වීමට බලය දී සිටින අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්‍යාල සහකාර වෙත භාරදීමට වුවද හැකිය. (එබඳු අවස්ථාවන්හිදී පූර්වෝක්ත 4 වෙනි ඡේදයෙහි සඳහන් වූ විස්තර ද ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ද, ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතුය).

6. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට පළමුව ටෙන්ඩර් තැන්පත් වශයෙන් රුපියල් 100 ක් කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ගෙවීම් ශාඛාවෙහි හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. සැම්පල, නියමිත පරිදි ඉදිරිපත් කළ යුතුය.

8. කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් (සැපයීම් ශාඛාව) ගෙන් ඉල්ලුම් කොට මේ පිළිබඳ වැඩිදුර විස්තර හා කොන්දේසි දැනගත හැකිය.

වී. කන්නන්ගර,
ගණකාධිකාරි, සැපයීම්,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් වෙනුවට.

1969 මාර්තු මස 27 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

4–106—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපතිතැන විසින් මසකට කියුබ් 100 ගණනේ 1½" කළුගල් කියුබ් 400 ක් පුත්තලමට සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969 අප්‍රේල් මස 30 වැනි බදාදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් භාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10ක් ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ කාර්යාලයේ තැන්පත් කර ලබා ගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉන්ජිනේරු තැන වෙත 1969 අප්‍රේල් 17 වැනි දින පස්වරු 4 ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැකිය.

4. මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් ෆෝර්ම ද කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉන්ජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉන්ජිනේරු තැන,
ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

තැ. පෙ. 370,
කොළඹ,
1969 මාර්තු 22 වැනි දින.

4–108—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 අප්‍රේල් මස 26 වන දින පෙ.ව. 10.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර මාතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| | පාසලේ නම | කළයුතු වැඩය | අවශ්‍ය ලියාපදිංචිය රු. |
|---|---|---|---|
| 1. | හ/කටුවන මහ විද්‍යාලය ... | කෘෂිකර්ම විද්‍යාගාරය ... | 20,000 |
| 2. | හ/තංගල්ල මහ විද්‍යාලය ... | 100′ × 20′ ගොඩනැගිල්ල | 25,000 |
| 3. | හ/කටුවන මහ විද්‍යාලය ... | විද්‍යාගාරය ... | 25,000 |
| 4. | හ/තංගල්ල මහ විද්‍යාලය ... | වාණිජ පන්තිකාමර තැනීම | 20,000 |
| 5. | හ/බෙලිඅත්ත මහ විද්‍යාලය... | 100′ × 20′ ගොඩනැගිල්ල | 25,000 |

සංලක්ෂ්‍යය :— හ—හම්බන්තොට දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාලයේ රු. 100 (සියය) ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය තංගල්ලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි වෙත ඉදිරිපත් කිරීමෙන් ඉහත සඳහන් ගණනට හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 අප්‍රේල් මස 25 වන දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නො වෙත්) චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම්, ආදිය භාරගනු නො ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ 2 මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ තංගල්ලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරින්ගේන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැකි ය. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි තංගල්ල ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනගත හැකි අතර, සැලැස්ම ආදිය බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් මාතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතු ය. තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිළිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පෞද්ගලිකව මාතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර/ප්‍රධාන ලිපිකරු වෙත භාරදිය යුතු ය. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතු ය.

5. 1969 අප්‍රේල් මස 26 වන දින ප.ව. 2.30 ට මාතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම හා මිළ ගණන්ද කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතු ය.

7. තවත් අවශ්‍ය විස්තරයක් වෙතොත් තංගල්ලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරීගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් කරන ලද පාසල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මඟින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සළකනු ලැබේ.

මාර්ටිනස් වැන්දබෝනා,
හම්බන්තොට ප්‍රදේශයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි.

1969 මාර්තු 23 දින,
තංගල්ලේ අධ්‍යාපන කාර්යාලයයේදී ය.

4–70/1—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 අප්‍රේල් මස 26 වන දින පෙ.ව. 10.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර තංගල්ල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| | පාසලේ නම | කළයුතු වැඩය | අවශ්‍ය ලියාපදිංචිය රු. |
|---|---|---|---|
| 1. | හ/මීගහවෙල විද්‍යාලය ... | වහල අළුත්වැඩියාව ... | 5,000 |
| 2. | හ/දෙබරවැව මහ විද්‍යාලය ... | විද්‍යාගාරයේ සිවිලිම අළුත්වැඩියාව | 5,000 |
| 3. | හ/බැදිගම විද්‍යාලය ... | වහළ අළුත්වැඩියාව ... | 5,000 |
| 4. | හ/මහආර විද්‍යාලය ... | අළුත්වැඩියාව ... | 5,000 |
| 5. | හ/වරාපිටිය මහ විද්‍යාලය ... | අළුත්වැඩියාව ... | 5,000 |
| 6. | හ/මීගහජඳුර විද්‍යාලය ... | ගුරුනිවාසයේ ඉතිරි වැඩ... | 5,000 |
| 7. | හ/අම්බලන්තොට විද්‍යාලය | ගුරුදෙගුරු සමිති ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ | 8,000 |
| 8. | හ/ලුණුගම්වෙහෙර විද්‍යාලය | වහල අළුත්වැඩියාව ... | 10,000 |

සංලක්ෂ්‍යය.— හ—හම්බන්තොට දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාලයේ රු. 100 (සියය) ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය තංගල්ලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි වෙත ඉදිරිපත් කිරීමෙන් ඉහත සඳහන් ගණනට හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 අප්‍රේල් මස 25 වන දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 10,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නො වෙත්) චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම්, ආදිය භාරගනු නො ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ 2, මැලේවීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ තංගල්ලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැකි ය. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂ ඉදිරිපත් කළ යුතු ය.

4. ටෙන්ඩර්පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි තංගල්ල ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනගත හැකි අතර, සැලැස්ම ආදිය බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් තංගල්ල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතු ය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිළිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පෞද්ගලිකව තංගල්ල අධ්‍යාපන කාර්යාලයේ, කාර්යාල සහකාර/ප්‍රධාන ලිපිකරු වෙත භාරදිය යුතු ය. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතු ය.

5. 1969 අප්‍රේල් මස 26 වන දින ප.ව. 2.30 ට තංගල්ල අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමැතිවිය යුතු ය.

7. තවත් අවශ්‍ය විස්තරයක් වෙතොත් තංගල්ලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් කරන ලද පාසල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මඟින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සළකනු ලැබේ.

මාර්ටිනස් වැන්දබෝනා,
හම්බන්තොට ප්‍රදේශයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි.

1969 මාර්තු මස 23 දින,
තංගල්ලේ, අධ්‍යාපන කාර්යාලයේදී ය.

4–70/2—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—මාතර

**මාතර සහ වැලිගම සැපයීම් මධ්‍යස්ථානවල සිට මාතර දිස්ත්‍රික්කයේ පාසල් කරා "ඇදිහැස" විස්කෝතු ගෙන යාම සහ භාරදීම**

වර්ෂ 1969 ක්වූ අප්‍රේල් 18 දින සිට 1969 සැප්තැම්බර් මස 30 දින දක්වා කාලය තුල පහත දැක්වෙන සේවයන් සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත්‍ර 1969 අප්‍රේල් මස 17 දින පෙරවරු 10.30 දක්වා මාතර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

එක ටෙන්ඩර් පත්‍රයක් :—

(1) මාතර සැපයීම් මධ්‍යස්ථානයේ සිට මාතර දිස්ත්‍රික්කයේ පිහිටි මාතර, දෙව්නුවර, කඹුරුපිටිය සහ හක්මන මණ්ඩලවල සියලුම පාසල්වලට "ඇදිහැස" විස්කෝතු (පෙට්ටිවල අසුරන ලද) පාසල් වාරයකට දෙවතාවක් බැගින් ප්‍රවාහණය කිරීම සඳහා සහ භාරදීම.

එක ටෙන්ඩර් පත්‍රයක් :—

(2) වැලිගම සැපයීම් මධ්‍යස්ථානයේ සිට මාතර දිස්ත්‍රික්කයේ පිහිටි වැලිගම්, අකුරැස්ස සහ දෙනියාය මණ්ඩලවල සියලුම පාසල් වලට "ඇදිහැස" විස්කෝතු (පෙට්ටිවල අසුරන ලද) පාසල් වාරයකට දෙවතාවක් බැගින් ප්‍රවාහණය කිරීම සහ භාරදීම.

ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ටෙන්ඩර් භාරදීමට අපේක්ෂා කරන ඉල්ලුම්කරුවන් විසින් මාතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත ඉල්ලුම්කරුට අයත් නිශ්චල දේපලවල වටිනාකම යටත් පිරිසෙයින් රු. 15,000ක් (පහළොස් දහසක්) වත් වන බව ඒත්තු යන අන්දමට හා ඉල්ලුම්කරුගේ නමින් ලියාපදිංචි කරන ලද ආදායම් වර්ෂයට බලපත්‍ර ලබාගත් ලොරි දෙකක් වත් අයිතිව තිබෙන බවටද සතුටුදායක අන්දමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. අනුමත කරන ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර කම්කරු සමිති මගින් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට ප්‍රථම මාතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත, සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාගෙන් (සමුපකාර සමිති වෙනුවෙන්) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂගෙන් (ග්‍රාම සංවර්ධන සමිති වෙනුවෙන්) හා කම්කරු කොමසාරිස්තුමාගෙන් (සමුපකාර කම්කරු සමිති වෙනුවෙන්) එකී සමිතියට මෙම වැඩය කිරීමට හැකියාවක් ඇති බවට සහතිකයක් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුයි.

මාතර ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයෙන් 1969 අප්‍රේල් මස 15 වෙනි දින පස්වරු 1 දක්වා ලබා ගතහැකි පෝරමවල, පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළයුතු වේ. ටෙන්ඩර් පෝරම ලබා ගැනීම සඳහා කච්චේරියේ රු. 50ක් (පනහක්) තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක්ද ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලබන්නේ ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලීමෙන් පසුවය. අමතර විස්තර මාතර ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයෙන් ලබා ගත හැක.

කේ. පතිරණ විමලධම්,
මාතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මාතර,
1969 මාර්තු 24 වෙනි දින.

**4–104—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය**

---

## ටෙන්ඩර් දැන්වීම

අංක 14,846 හා 69.3.21 දින දරණ රජයේ ගැසට් පත්‍රයේ පළවූ 69.3.13 දින දරණ මගේ ටෙන්ඩර් දැන්වීමට අමතරවයි.

එම දැන්වීමේ පළමුවන ඡේදයේ අංක 4 දරණ කාර්යය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුයි :—

4. මහ/ගම්පල සහිරා ම.වි. ... 80 × 20 පාසල් ගොඩනැගිල්ල
5. මහ/ජිතරාජ ම.වි. ... 80 × 20 පාසල් ගොඩනැගිල්ල

රු. 20,000 ක් හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ට මේ එක් එක් වැඩක් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

පී. බී. රත්නායක,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, මහනුවර.

අධ්‍යාපන කාර්යාලය,
මහනුවර, 1969 මාර්තු 25 දින.

**4–103—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය**

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**කොළඹ දකුණ ප්‍රදේශයේ පාසැල්වලට කිරි විස්කෝතු ගෙන යාම**

මෙහි පහත දැක්වෙන සේවාවන් සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(1) මැලිබන් හා ලංකා විස්කෝතු සමාගමේ විස්කෝතු නිෂ්පාදන ස්ථානවල සිට රු. 20 පෙට්ටිවල අසුරන ලද විස්කෝතු පහත දැක්වෙන මණ්ඩලයන්හි පිහිටි පාසැල් වෙත ප්‍රවාහනය කිරීම.

(2) එම මණ්ඩල වල පිහිටි පාසල්වල ඇති හිස් ටින් ආපසු විස්කෝතු නිෂ්පාදන ස්ථානයන් වෙත ගෙන ඒම.

සඳහන් කරන ලද මණ්ඩල මෙපරිදිය.

| | |
|---|---|
| 1. මැද කොළඹ | 7. කොළොන්නාව |
| 2. උතුරු කොළඹ | 8. කොට්ටාව |
| 3. දකුණු කොළඹ | 9. හෝමගම |
| 4. දෙහිවල-ගල්කිස්ස | 10. අවිස්සාවේල්ල |
| 5. මොරටුව | 11. කැස්බෑව |
| 6. කෝට්ටේ | 12. බොරැල්ල. |

ඉහත සඳහන් මණ්ඩල සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 7, ග්‍රීන්පාත්හි, දකුණු කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 1969 අප්‍රේල් මස 17 වෙනි දින පෙ. ව. 10.30 තෙක් බාර ගනු ලැබේ.

කොළඹ 7, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍ර මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු වේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පෙර රු. 100 ක තැන්පත් මුදලක් කොළඹ 7, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත් අයට 1969 අප්‍රේල් මස 15 වෙනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. අනුමත කරන ලද සමිතියක් නම් එකී මුදල් තැන්පත් කිරීම අනවශ්‍ය ය.

ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට පෙර ටෙන්ඩර් භාර දීම අපේක්ෂා කරන අයවලුන් විසින් කොළඹ 7, ග්‍රීන්පාත්හි, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත රුපියල් 10,000 ක් වටිනා ස්ථිර දේපල ඇති බවට ඒත්තු යන පරිදි සහතිකයක් හා ඉල්ලුම්කරුගේ නමින් ලියාපදිංචි කරන ලද 1969 වර්ෂයේ බලපත්‍රයක් ලබා ගත් එක් ලොරියක් වත් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. අනුමත කරන ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමිති, මගින් ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමට පෙර කොළඹ 7, ග්‍රීන්පාත්හි, අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වරයාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තුමාගෙන් හෝ කම්කරු කොමසාරිස් තුමාගෙන් එකී සමිතියට මෙම සේවය ඉටු කිරීමට හැකියාවක් ඇති බවට සහතිකයක් යථා යෝග්‍ය පරිදි ලබා ගෙන ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් අවශ්‍යතාවන් සම්පූර්ණ නොකළ අයට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු නොලැබේ.

කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් හෝ ඇදිහැස සංවිධානයෙන් හෝ නිකුත් කිරීමේ ඇණවුම් පත් ලැබී සතියක් ඇතුලත පාසැල්වලට විස්කෝතු ගෙන ගොස් බාර දීම කළ යුතුවේ. ටෙන්ඩරයක් සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කිරීම හෝ එහි කොටසක් පමණක් භාර ගැනීමේ හෝ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය. ටෙන්ඩර් අපේක්ෂකයින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළිබඳ අවසාන තීරණය සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක් කල් දිය යුතුය. ටෙන්ඩර් පිළිබඳ සියලුම කොන්දේසි හා වෙනත් විස්තර කොළඹ 7, ග්‍රීන්පාත්හි, ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාලන නිලධාරි ගෙන් ලබා ගත හැකිය.

වී. ජී. බී. මුණසිංහ,
කො. ප්‍ර. අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969.3.27 වැනිදා,
කොළඹ 7, ග්‍රීන්පාත්,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී.

**4–161—69.4.3. දින අංක 14,848 දරන ගැසට් පත්‍රය**

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 අප්‍රේල් මස 25 වැනි සිකුරාදා පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ග්‍රීන්පාත්, කොළඹ 7, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. කො/අධ්‍යාපන අමාත්‍යාංශය | පාසැල් වැඩ අංශය අළුත් වැඩියාව |
| 2. කො/දාම්පෙ විද්‍යාලය | කණිෂ්ඨ ... අළුත්වැඩියාව |
| 3. කො/අධ්‍යාපන අමාත්‍යාංශය | ගරාජ අළුත්වැඩියාව. |

සංලක්ෂ්‍යය.—කො = කොළඹ දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයේ හෝ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1 රු. 9,000, අංක 2 සහ 3 රු. 2,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 අප්‍රේල් මස 23 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්). චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදිය ද බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියා පදිංචි තැපැලෙන් ග්‍රීන්පාත් කොළඹ 7, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පුද්ගලිකව ග්‍රීන්පාත්, කොළඹ 7, අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර/ප්‍රධාන ලිපිකාර වෙත භාරදිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 අප්‍රේල් මස 25 වැනි සිකුරාදා පෙ. ව. 10.30 ට ග්‍රීන්පාත් කොළඹ 7 අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන් ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති 6ක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ කාර්යාලයයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන් ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

වී. ජී. බී. මුණසිංහ,
අධ්‍යාපන අධ්‍යක්ෂ,
කොළඹ ප්‍රදේශය.

1969.3.27 වැනිදා,
කොළඹ 7, ග්‍රීන්පාත්,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී.

4–160—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු (ගොඩනැගිලි) යටතේ ඉදිකෙරෙන ගොඩනැගිලි සඳහා ගොඩනැගිලි උපකරණ සැපයීම

කොළඹ මහ නගර සභා සීමාව තුළ සහ එම සීමාවෙන් සැතපුම් 12 ක් ඇතුළත මෙම සංවිධානය මගින් කරනු ලබන ඉදිකිරීම් වැඩ සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය සහ උපකරණ රාශියක් අවශ්‍ය වේ. මොරටුව – රත්මලානේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු (ගොඩනැගිලි) තැන වෙත ලියාපදිංචි වන සැපයුම්කරුවන්ගෙන් පමණක් ඒ ඒ අවස්ථාවන්හිදී ලබා ගන්නා ලද මිළ ගණන් අනුව ගොඩනැගිලි උපකරණ සහ ද්‍රව්‍ය සපයා ගනු ලැබේ. දැනට සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි වී ඇති අය නැවතත් ලියාපදිංචිකිරීම පිණිස අළුත් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුය. 30.5.69 වන දින සිට මාසයක් ඇතුළත ඉල්ලුම්කරුවකු, සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි කරගත් බැව් දන්වනු ඇත.

ගොඩනැගිලි උපකරණ සහ ද්‍රව්‍ය සැපයීම සඳහා ලියාපදිංචිවීමට කැමති අය විසින් 69.4.30 වන දින දවල් 12 ට පෙර මොරටුව–රත්මලානේ ර. වැ. දෙ. ගොඩනැගිලි ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැන වෙත ස්වකීය නම් සහ ලිපිනයන් ඉදිරිපත් කළ යුතුය. ලියුම් කවරයේ වම් පැත්තේ උඩකෙළවරේ "ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම—ප්‍ර. නි. ඉ. රත්මලාන" යනුවෙන් සඳහන් කළ යුතුය. ද්‍රව්‍ය සහ උපකරණ සැපයීමට ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කෙරෙන ඉල්ලුම් පත් සමග පහත සඳහන් විස්තරද සැපයිය යුතුය :—

(i) ඉල්ලුම්කරුට සැපයිය හැකි කුමන ගොඩනැගිලි උපකරණ සහ ද්‍රව්‍යදැයි දක්වෙන ලැයිස්තුවක්.

(ii) ලොරි, ටිපර් සහ ට්‍රැක්ටර් වැනි තමන් සතු වාහනවල ලියා පදිංචිකිරීමේ අංක දක්වෙන ලැයිස්තුවක්. එක් එක් වාහනය මේ අවුරුද්ද සඳහා ලියා පදිංචි කොට සහ රක්ෂණය කොට තිබේදැයි සඳහන් කළ යුතුය.

(iii) මෙවැනි සැපයීම් වැඩ කොට ලත් පළපුරුද්ද සනාථ කිරීමේ ලිඛිත සාධක.

(iv) ඉල්ලුම්කරුට මෙවැනි වැඩ කිරීමට ඇති හැකියාව දක්වෙන සහ ඔහුගේ වර්තමාන වත්කම් පිළිබඳ තමන් පදිංචි කොට්ඨාශයේ ආදායම් පාලක නිලධාරිතුමාගෙන් ලබා ගත් සහතිකයක්.

අවශ්‍ය වී තිබෙන උපකරණ පහත සඳහන් වේ :—

1. පිරවීම සඳහා බොරළු පස්
2. අඟල් 6 සිට අඟල් 9 දක්වා සක්ක ගල්
3. අඟල් 2 කළුගල්
4. අඟල් 1 කළුගල්
5. අඟල් $\frac{3}{4}$ කළුගල්
6. අඟල් 1 1/2 කළුගල්
7. ගංගා වැලි
8. ගඩොල්
9. අලුහුණු හා පුච්චාපු හුණු
10. වැරැටි හුණු
11. පලංචි සඳහා උණබම්බු
12. දැව
13. හැකිලිය හැකි වානේ ගේට්ටු
14. යකඩ ජනෙල් (ලූවර්)
15. වෙරාසෝ වැඩ.

එච්. සී. සී. ද සිල්වා,
ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු (ගොඩනැගිලි).

ර. වැ. දෙ.,
තැ. පෙ. 6,
මොරටුව.

4–167—69.4.3. දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනා ගමන මණ්ඩලය

### ප්‍රධාන ඩිපෝවල තිබෙන අබලි හා අනවශ්‍ය ද්‍රව්‍ය විකිණීම

එක් එක් දිශාව ඉදිරියෙන් දක්වා ඇති ස්ථානයන්හි තිබෙන බ්‍රේක් ඩ්‍රම්, රිම්, හබ්, දුනුකොළ, ටියුබ්, ෆ්ලැප්, බස්සීට්, රාමු, ෂොක්ඇබ්සෝබර, මිශ්‍ර අමතර කොටස්, යනාදියෙන් යුක්තවූ අබලි හා අනවශ්‍ය ද්‍රව්‍ය මිළදී හැරගෙන යාම සඳහා එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර පත්‍ර, පහත සඳහන් දිශාවල ලංකා ගමනාගමන මණ්ඩලයේ දිශා ටෙන්ඩර් මණ්ඩලීය සභාපතිවරුන් විසින් බාරගනු ලැබේ. පහත සඳහන් ලිපිනයන්හි සිටින ඒ ඒ දිශා කළමනාකාරවරුන්ගේ කාර්යාලවලදී හෝ මගේ කාර්යාලයේදී මුදලින් රු. 50 ක් තැන්පත් කර ටෙන්ඩර් ෆෝරම ලබාගත හැක.

| | දිශාව | අබලි ද්‍රව්‍ය තිබෙන ස්ථානය | ටෙන්ඩර් බාරගන්නා නිලධාරි තැනගේ ලිපිනය |
|---|---|---|---|
| 1. | කොළඹ දකුණ | ලං.ග.ම. ඩිපෝව, රත්මලාන | ... සභාපති තැන, ලං.ග.ම. දිශා ටෙන්ඩර් මණ්ඩලය, දිශා කාර්යාලය, කොළඹ දකුණ, නො. 170, හයිලෙවල් පාර, නුගේගොඩ |
| 2. | මැද කොළඹ ... | ... ලං.ග.ම. ඩිපෝව, මීතොටමුල්ල | ... සභාපති තැන, ලං.ග.ම. දිශා ටෙන්ඩර් මණ්ඩලය, දිශා කාර්යාලය, මැද කොළඹ, නො. 170, හයිලෙවල් පාර, නුගේගොඩ |
| 3. | මීගමුව ... | ... ලං.ග.ම. ඩිපෝව, මීගමුව | ... සභාපති තැන, ලං.ග.ම. දිශා ටෙන්ඩර් මණ්ඩලය, දිශා කාර්යාලය, නො. 11/4, සෙන්ට් නියනියන්ස් මාවත, මීගමුව |
| 4. | බදුල්ල ... | ... ලං.ග.ම. ඩිපෝව, බදුල්ල | ... සභාපති තැන, ලං.ග.ම. දිශා ටෙන්ඩර් මණ්ඩලය, දිශා කාර්යාලය, පස්සර පාර, හිඳගොඩ, බදුල්ල |
| 5. | අනුරාධපුරය ... | ... ලං.ග.ම. ඩිපෝව අනුරාධපුර | ... සභාපති තැන, ලං.ග.ම. දිශා ටෙන්ඩර් මණ්ඩලය, දිශා කාර්යාලය, ජයන්ති මාවත, අනුරාධපුර |
| 6. | කොළඹ නැගෙනහිර | ... ලං.ග.ම. ඩිපෝව, මහරගම | ... සභාපති තැන, ලං.ග.ම. දිශා ටෙන්ඩර් මණ්ඩලය, දිශා කාර්යාලය, කොළඹ නැගෙනහිර, නො. 170, හයිලෙවල් පාර, නුගේගොඩ |

7. විකිණීමට ඇති ද්‍රව්‍ය සඳහන් ලැයිස්තු හා වැඩි විස්තර ඒ ඒ දිශා කළමනාකාරවරුන්ගේ කාර්යාලවලින් හෝ කොළඹ 5, කිරුල පාරේ 200 වෙනි ස්ථානයේ පිහිටි ලං.ග.ම. ප්‍රධාන සම්පාදක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

**1969.4.21 වෙනි දින පෙරවරු 10.00ට ටෙන්ඩර් බාරගැනීම අවසාන කරනු ලැබේ.**

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන.

4–156—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඉප/333/260 (68/69)

## ගාලු කච්චේරිය — ටෙන්ඩර් කැඳවීම පිළිබඳ දැන්වීමයි

ගාලු දිස්ත්‍රික්කයේ පහත උප ලේඛනයේ සඳහන් තැනීම් වැඩ සඳහා 1969 අප්‍රේල් මස 25 වැනි සිකුරාදා ප.ව. 2.30 වන තෙක් කොළඹ (තැ.පෙ. 500) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. එම ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර් කරුවන්ට එම කාර්යාලයට පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර් තැන්පත් කරන පෙට්ටිය ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයේ තුන්වෙනි තට්ටුවේ පිහිටි ඉඩම් කොමසාරිස් කාර්යාලයේ අංක 357 දරණ කාමරයේ තබනු ඇත. එක් එක් වැඩය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු වේ.

2. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ ගාල්ලේ දිසාපති වෙතින් ලබාගත යුතු වන ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තවයි. මෙම වැඩ පිළිබඳ සැලසුම් පූර්වෝක්ත දිසාපති කාර්යාලයේ දී බැලිය හැකි වන අතර, ඒ පිළිබඳ සියලු විස්තර ඔහු වෙතින් ලබා ගත හැක.

3. පහත සඳහන් ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩි මුදලකට කොන්ත්‍රාත් වැඩ සඳහා රජයේ ලියාපදිංචි වී ඇති පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට හා රජයේ වැඩ, වාරිමාර්ග, අධ්‍යාපන හෝ වෙනත් දෙපාර්තමේන්තුවල ඒ ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වී ඇති, මෙවැනි වැඩ හොඳින් කිරීමට හැකියාවක් තිබෙන සමුපකාර හා ග්‍රාම සංවර්ධන සමිතිවලට ද මෙම වැඩ සඳහා ඉල්ලුම් කළ හැකි අතර, ඒ වෙනුවෙන් ඉහත සඳහන් දිසාපති වෙත එසේ ලියාපදිංචි වී තිබීම හා හැකියාව පිළිබඳ සාධකත්, රු. 100ක ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා වූ කුවිතාන්සියත් ඉදිරිපත් කළ යුතු වන්නේය. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන අවසාන දිනය 1969 අප්‍රේල් මස 19 වැනිද පස්වරු 3.00 දක්වා වන්නේය. ලියාපදිංචි සමිති විසින් ටෙන්ඩර් තැන්පත් තැබීම අවශ්‍ය නොවේ. එහෙත් ඒ ඒ සමිතිවලට අදල දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික්ක ප්‍රධානීන්ගෙන් ලබාගත් තමන්ගේ හැකියාවන් පිළිබඳ සහතික මා වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

4. මෙම ටෙන්ඩර් තැන්පත් මුදල ගාල්ලේ දිසාපති කාර්යාලයේ හෝ ගාල්ලෙන් පිටත ඕනෑම දිසාපති කාර්යාලයකදී හෝ කොළඹ මුදල් භාණ්ඩාගාරයේ දී හෝ ගෙවීමට පිළිවන.

5. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ "..................................................සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් විය යුතු අතර, සියලුම ටෙන්ඩර් පත්‍ර අත්සන් තබා සීල් කර, සුරක්ෂිතව ඉදිරිපත් කළ යුතුයි.

සෝමපාල කළුආරච්චි,
උප දිසාපති,
ගාල්ලේ දිසාපති වෙනුවට.

1969 මාර්තු මස 23 වෙනි දින,
ගාල්ලේ, දිසාපති කාර්යාලයේ දී ය.

### උප ලේඛනය

| | වැඩ විස්තරය | පිහිටි ප්‍රදේශය | ලියාපදිංචි තිබියයුතු මුදල රු. |
|---|---|---|---|
| 1. | මත්තක ගොඩාමුණ පාර 1 වැනි සැතපුම ඉතිරි වැඩ | බෙ. ව. කෝ. (නැගෙණහිර) | 50,000 |
| 2. | මත්තක-පොරවගම පාරේ 1 වැනි සැතපුම පාලම තැනීම | එම ... | 50,000 |
| 3. | නාපේ උස්බිම් ජනපද අභ්‍යන්තර පාර ... | බෙ. ව. කෝ. (බටහිර) | 30,000 |
| 4. | පිටුවල—තරුණ ගොවි ජනපද අභ්‍යන්තර පාර ගල් අතුරා තාර දැමීම | බෙ. ව. කෝ. (නැගෙණහිර) | 50,000 |

4–94—69.4.3 දින අංක 14,848 දරන ගැසට් පත්‍රය

---

## ලංකා උසස් කාර්මික විද්‍යායතනය—කටුබැද්ද

ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සහ වැඩිදියුණු කිරීම සම්බන්ධව ටෙන්ඩර්පත්‍ර ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාර ගනු ලැබේ. අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේත්, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේත් රු. 35,000කට වඩා වැඩි ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ඉහත සඳහන් ගණන සඳහා අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේත්, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේත් ලියාපදිංචි වූ අනුමත කරන ලද සමිතිවලට ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලය ඇත. අනුමත කරන ලද සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් යෙදීමෙන් නිදහස් කරනු ලැබේ. එහෙත්, ඉහත සඳහන් ගණන්වලට ලියාපදිංචි වී තිබෙන බවට සාක්ෂි ටෙන්ඩර් ආකෘති නිකුත් කිරීමට පෙර ඉදිරිපත් කළ යුතුය.

2. ටෙන්ඩර් පිටපත් දෙකකින් යුක්තව එකම කවරයේ සීල් තබා, සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, ලංකා උසස් කාර්මික විද්‍යායතනය, කටුබැද්ද-මොරටුව යන ලිපිනයට එවිය යුතු ය.

3. ටෙන්ඩර් සියල්ලම ලේඛනගත තැපැලෙන් එවිය යුතුයි. නැතහොත් ටෙන්ඩර්කරුගේ හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින්

සීල් තබන ලද ටෙන්ඩර් ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ගණකාධිකාරී වෙත පුද්ගලිකව භාර දී ඒ සඳහා රිසිට් පතක් ලබා ගත යුතු යි.

4. ටෙන්ඩර් සියල්ලම "ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම් සහ වැඩිදියුණු කිරීම්" යනුවෙන් කවරයේ වම්පැත්තේ උඩ කෙලවරේ ලකුණු කොට මුද්‍රා තබන ලද ඒවා විය යුතු යි. එම ටෙන්ඩර් 1969 අප්‍රේල් මස 25 වැනි දින උදේ 10ට පෙර ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලැබිය යුතුයි.

5. 1969 අප්‍රේල් මස 21 වැනි දින දවල් 12 දක්වා ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂගෙන් ලබා ගත යුතු ආකෘති පත්‍ර වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

6. එහි සඳහන් කරන ලද කොන්දේසිවලට අනුකූලව අනුමත කරන ලද ආකෘති පත්‍රයේ ඉදිරිපත් නො කරන ලද ටෙන්ඩර් කිසිවක් සැළකිල්ලට භාජනය කරනු නො ලැබේ.

7. ටෙන්ඩර්වල වෙනස්කිරීම් සහ මැකීම්වලට ටෙන්ඩර්කරුවන් විසින් කෙටි අත්සන යෙදිය යුතුයි.

8. ටෙන්ඩර් ආකෘති නිකුත් කිරීමට පෙර ඒ සඳහා රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයට ගෙවා රිසිට් පතක් ලබා ගෙන එය ඉදිරිපත් කළ යුතුයි. චෙක්පත් සහ මුදල් ඇණවුම් ආදිය භාර ගනු නො ලැබේ. ටෙන්ඩර්පත් ලබා ගෙන ටෙන්ඩර් ඉදිරිපත් නො කරන ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනු නො ලැබෙන අතර, ඒවා ආදායමට බැර කරනු ලැබේ.

